

වාර්ෂික වාර්තාව

2018



ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

පටුන

- සම්බන්ධීකරණ තොරතුරු.....01
- දැක්ම සහ මෙහෙවර 02
- සංස්ථාමය තොරතුරු 03-07
- සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව.....08-34
- මූල්‍ය වාර්තා 35-38
    - මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.....35
    - ආදායම පිළිබඳ ගිණුම් ප්‍රකාශය.....36
    - ස්කන්ධය මත වෙනස්වීම් පිළිබඳ ගිණුම් ප්‍රකාශය.....37
    - මුදල් ප්‍රවාහ ප්‍රකාශය.....38
- ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන්.....39-55
- විගණකාධිපති වාර්තාව.....56-68
- විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් ආයතන ගත් ක්‍රියාමාර්ග.....69-77



දැක්ම සහ මෙහෙවර


දැක්ම
වැවිලි ක්ෂේත්‍රයේ රජය සතු
ප්‍රබලතම වාණිජ ව්‍යවසායකත්ව
ආයතනය බවට පත්වීම
මෙහෙවර
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වත්කම් සේවක
සහභාගිත්වයෙන් නිසි කළමනාකරණය කරමින් රටේ
දළ දේශීය නිෂ්පාදිතයට සහ වතු සේවක පවුල්වල සහ
අසල්වැසි ගම්මානයන්හි යහ සාධනය ඇති කිරීමට
උපරිම දායකත්වයක් ලබාදීම

සංස්ථාමය තොරතුරු

අධ්‍යක්ෂ මණ්ඩලය 2018

නම	තනතුර
එම්. ජී. ජී. තිලකසිරි මයා	සභාපති/ප්‍රධාන විධායක නිළධාරි
පෙරුමාල් රමේෂ් මයා	අධ්‍යක්ෂ/ ක්‍රියාකාරී අධ්‍යක්ෂ
අසෝක මුතුමාල මයා	අධ්‍යක්ෂ
එම්.වයි.එම්. සිබ්ලි මයා	මණ්ඩල සාමාජික (2018 ජනවාරි සිට 2018 ඔක්තෝම්බර්)
එම්.ආර්.එම් ආබ්ඩීන් මයා	මණ්ඩල සාමාජික (2018 ජනවාරි සිට 2018 මැයි)
පී.ඊ් වැන්ඩපුටන් මයා	මණ්ඩල සාමාජික
ඒ.ජේ.එම්.ඩි.පී.බී අවිරුප්පොල මයා	මණ්ඩල සාමාජික
පාලිත ඩී. සිල්වා මයා	මණ්ඩල සාමාජික (2018 ජනවාරි සිට 2018 ඔක්තෝම්බර්)
ඩී.ආර්.බී රත්නායක මයා	මණ්ඩල සාමාජික (2018 අගෝස්තු සිට 2018 දෙසැම්බර්)
එස්. රාජරත්නම් මයා	මණ්ඩල සාමාජික (2018 අගෝස්තු සිට 2018 දෙසැම්බර්)
ඊ්.එම්.ඩී.ඩබ්.ඒ.එස්.කේ අමුණුගම මයා	මණ්ඩල සාමාජික (2018 අගෝස්තු සිට 2018 දෙසැම්බර්)
එච්.එන්.පී.ජිනසේන මයා	සාමාන්‍යාධිකාරී / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

විගණන කළමනාකරණ සාමාජිකයින්

- 2018 වර්ෂයෙහි කිසිදු විගණන කමිටු රැස්වීමක් පවත්වා නොමැත.

කළමනාකරණය - ප්‍රධාන කාර්යාලය -2018

නම	තනතුර
එම්. ජී. ජී. තිලකසිරි මයා	සභාපති/ප්‍රධාන විධායක නිළධාරි
එච්.එන්.පී.ජිනසේන මයා	සාමාන්‍යාධිකාරී
එස්. අයි. එම්. හසන් මයා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය
බී. වී. එල්. සී. බෙනරගම මිය	කළමනාකාරිණී ප්‍රසම්පාදන
ජේ. එච්. අයි. ජයසුන්දර මයා	වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී /කළමනාකරු - පරිපාලන
ඩබ්.ඩි. කීර්ති මයා	කළමනාකරු - අළෙවිකරණ
කේ.ඒ.එච්.ඩි පෙරේරා මිය	කළමනාකාරිණිය - සාමාන්‍යාධිකාරී අංශය
එන්.ඒ.ඒ නිකපිටිය මිය	කළමනාකාරිණිය - නීති
යූ. එස් විතානගේ මයා	ගණකාධිකාරි
වී. කදිර්ගාමර් මයා	සහකාර කළමනාකරු -වැවිලි
ඊ්.ආර්.අයි.බී.එස්.එස් බණ්ඩාර මයා	අභ්‍යන්තර විගණන නිලධාරි
ජී.ඩි.එස්.සී සුදසිංහ මෙනවිය	සහකාර කළමනාකරු- පරිපාලන
ජී.බී.සී ෆොන්සේකා මයා	සහකාර කළමනාකරු- පරිපාලන
එච්.එම්.එස්.එන් හේරත් මෙය	සහකාර කළමනාකාරිණිය- අලෙවි
පී. වී. ප්‍රදීප් මයා මයා	සහකාර කළමනාකරු- ප්‍රවාහන
ගයාන් යාපා මයා	සහකාර කළමනාකරු -ඉඩම්
පී.සී.ජේ පනාගොඩ මයා	සහකාර ගණකාධිකාරී
සුමුදු කැකුලන්දල මයා	නීති නිළධාරී

කළමනාකරණය - වතුයායන් - 2018

නම	තනතුර සහ වතුයාය
වයි. ඒ. ටී. බී. වඩුගොඩපිටිය මයා	වතු අධිකාරි - අළුලකොල රාජ්‍ය වතුයාය
ටී. එම්. පී. ජී. අයි. තෙන්නකෝන් මයා	වතු අධිකාරි - ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය
ටී. ආර්. එච්. හේවගේ මයා	වතු අධිකාරි - හාගල රාජ්‍ය වතුයාය
ආර්. ඒ. ආර්. එම්. රණවක මයා	වතු අධිකාරි - හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය
ඒ. සී. අබේවර්ණ මයා	වතු අධිකාරි / නි.සා. කලාප I - කැලෑබොක්ක රාජ්‍ය වතුයාය
ඩබ්. ටී. කේ. සමරතුංග මයා	වතු අධිකාරි - මිඩ්ලන්ඩ්ස් රාජ්‍ය වතුයාය
පී. අයි. එල්. පෙරේරා මයා	වතු අධිකාරි/නි.සා. කලාප II - රංගල රාජ්‍ය වතුයාය
අයි.ඩබ්ලිව්.ආර් ජයවර්ධන මයා	වතු අධිකාරි වලහන්දුව රාජ්‍ය වතුයාය
ඩී .ඩබ්ලිව්.ටී. සී දන්තසිංහ මයා	වතු අධිකාරි - වෛතලාව රාජ්‍ය වතුයාය
ආර්. ඒ. එම්. දයාරත්න මයා	වතු අධිකාරි - ගෝමර රාජ්‍ය වතුයාය
ඒ. ඒ. සේනාරත්න මයා	වතු අධිකාරි - කොටගහ රාජ්‍ය වතුයාය
එස්. වයි. ලියනගේ මයා	වතු අධිකාරි - හෙයාර්පාක් රාජ්‍ය වතුයාය
ජී. ඩබ්. ජී. විජේරත්න මයා	වතු අධිකාරි - ඕපල්ගල රාජ්‍ය වතුයාය
කේ.ඩී.එම්.පී වීරසිංහ මයා	වැඩබලන කළමනාකරු (වතු)
එම්.එම්.එම්.සී.බී ඇහැලමල්පේ මයා	(වැඩ බලන) වතු අධිකාරි - වූඩ්සයිඩ් රාජ්‍ය වතුයාය
සී.එස්.එස්.එම්.දිසානායක මයා	(වැඩ බලන) වතු අධිකාරි - නිකොළොය රාජ්‍ය වතුයාය
එම්.ඩී.එම්.සී.ජේ.දසනායක මයා	වතු අධිකාරී (විදේශගත නිවාඩු)

සංවිධාන ව්‍යුහය



ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාලය සහ වතුයායන්හි කාර්යමණ්ඩලය		
HM 2-1	සාමාන්‍යාධිකාරී	1
HM 1-1	නි.සාමාන්‍යාධිකාරී - මූල්‍ය, පාලන	3
MM 1-1	කළමනාකරු -නීති, පාලන, ඉඩම, වැවිලි, අලෙවිකරණ, ප්‍රසම්පාදන, අභ්‍යන්තර විගණක,ගණකාධිකාරී, වතු අධිකාරී	21
JM 1-1	විගණන නිලධාරී, සහකාර ගණකාධිකාරී, සහකාර කළමණාකරු - ප්‍රවාහන, අලෙවිකරණ, පාලන, සහකාර වතු අධිකාරිවරු, පරිපාලන සහකාර	24
MA 5-2	පුද්ගලික සහකාර-සභාපති සහ පුද්ගලික සහකාර-සාමාන්‍යාධිකාරී	2
MA 1-1	කළමණාකරණ සහකාර	30
PL 3	රියදුරු	5
PL 1	ආයතන සහකාර	3
එකතුව		89

රූපය 01 - සංවිධාන ව්‍යුහය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතුයායන්ගේ ව්‍යාප්තිය



රූපය 02 - ශ්‍රී ලංකාවේ තේ වතු ව්‍යාප්තිය

සභාපතිතුමාගේ පණිවිඩය



2020 වර්ෂයේ පෙබරවාරි මස, මා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සභාපති ධුරයේ වැඩ භාර ගන්නා විට 2016 වර්ෂය දක්වා පමණක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර තිබූ අතර 2017, 2018 හා 2019 යන වර්ෂයන්හි, අවසන් ගිණුම් සකස්කර නොතිබුණි. ඒ අනුව, එම වර්ෂයන්හි වාර්ෂික වාර්තා පිළියෙල කිරීම කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය උපදෙස් මා විසින් ලබා දෙන ලදී.

ආයතනයේ 2018 වර්ෂයේ රුපියල් මිලියන 147.8ක අලාභයක් වාර්තා කර ඇති අතර 2017 වර්ෂයේ සංස්ථාවේ අලාභය රුපියල් මිලියන 94.9ක් වේ. ඒ අනුව පෙර වර්ෂයට වඩා 2018 වර්ෂයේ අලාභය වැඩිවීමේ ප්‍රතිශතය 55.74% වේ.

2018 වර්ෂයේදී අමු දළු කිලෝ ග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය රු. 102.07වේ. සංස්ථාවේ 2017 වසරේ දී කිලෝ ග්‍රෑම් 563,818ක් වූ මුළු නිමි තේ නිෂ්පාදනය 2018 වසර තුළදී කිලෝ ග්‍රෑම් 572,318 ක් දක්වා 1.5% කින් වැඩි වී ඇත.

2017 වසරේ දී නිමි තේ කිලෝ ග්‍රෑම් එකක සාමාන්‍ය විකුණුම් මිල රුපියල් 437.78 ක් වන අතර 2018 වසරේ දී රුපියල් 408.68ක් දක්වා 6.65%කින් අඩු වී ඇත. එලෙසම 2017 වසරේ දී නිමි තේ කිලෝ ග්‍රෑම් 01 ක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය රුපියල් 601.77ක් වන අතර 2018 වසරේ දී රුපියල් 574.10ක් වේ.

වතුවල අඩු ඵලදායීතා, අලෙවි අලාභ, කර්මාන්තශාලාවල ඉහළ නිෂ්පාදන පිරිවැය ,අහිතකර පාංශු තත්ත්වයන් (නාය යාම/ බෑදනය /අඩු පෝෂණ මට්ටම) සහ අයහපත් කාළගුණික තත්ත්වයන් සංස්ථාවේ මූල්‍ය අස්ථායීතාව කෙරෙහි හේතු වී ඇත. මේ අතර, පරිපාලනමය, ප්‍රසම්පාදන ගැටළු සහ වන කළමනාකරණ සැලැස්මට අනුව දැව හෙලීම සඳහා අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීම යනාදී කරුණු හේතු කොට ගෙන දැව සඳහා ගස් විකිණීම පහත වැටී ඇත. ප්‍රමාණවත් ආදායමක් හා ප්‍රතිපාදන උත්පාදනය කර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන්, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා අවශ්‍ය යෙදවුම් ප්‍රමාණවත් පරිදි සැපයීමට නොහැකි වී ඇති අතර තේ කර්මාන්තශාලා නිරන්තරව නඩත්තු කිරීමට සහ නවීකරණ කටයුතු කිරීමට අපොහොසත් වී ඇත. ඒ හේතුවෙන් පසුගිය වසර කිහිපය මුළුල්ලේම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අලාභ තත්ත්වයක් වාර්තා කර ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතුයායන් ලෝක උරුමයක් වන නකල්ස් රක්ෂිතය වටා පිහිටා ඇති බැවින් ඉතා සුන්දර ස්ථාන රාශියක් අප වතුයායන් තුළ පිහිටා ඇත. රිවර්ස්ටන් පිවිසුම් මාර්ගය, දන්කන්ද වැව හා කඳවුරු භූමිය. 360^0 දර්ශන පථය, තැලිය වැටුන ඇල්ල, ජෝඩු ඇල්ල, සාරි ඇල්ල, වැවතැන්න කඳවුරු භූමිය හා ජලාශය ඇතුළු අලංකාර භූ දර්ශන රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතුයායන් තුළ පිහිටා ඇත. දැනට මෙම ස්ථාන නැරඹීමට දේශීය හා විදේශීය සංචාරකයන් විශාල පිරිසක් පැමිණෙන අතර ඔවුන්ට අවශ්‍යය ඉතා සීමිත පහසුතම් සැපයීමෙන් දැනට යම් ආදායමක් සංස්ථාව ලබන අතර හොඳ පහසුකම් සැපයීම මඟින් ඉහළ ආදායමක් ලබා ගත හැකි බව මාගේ නිරීක්ෂණයයි.

2019 වසරේ සැප්තැම්බර් 30 දිනට පෙර නිමකල යුතු වූ මෙම 2018 වසරේ වාර්ෂික වාර්තාව වසර ගණනාවක සිට නියමිත දිනට වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීමට නොහැකිවීම මත වසර තුනක් ප්‍රමාද විය. 2021 වසර වන විට නියමිත දිනට වාර්ෂික ගිණුම් අවසන් කර 2018 වසරේ වාර්ෂික වාර්තාව සකස් කළ ශ්‍රී රාජ්‍ය වැවිලි සංස්ථාවේ වත්මන් කාර්යය මණ්ඩලයට මාගේ ස්තුතිය පිරිනමමි.

ඒ අනුව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

නීතීඥ ශ්‍රීමාල් විජේසේකර
සභාපති
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

සංස්ථාපිත පසුබිම

සමාගමේ නම:

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

නීතිමය ස්ථාපනය:

මෙම සමාගම 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත සහ 1962 අංක 12 හා 1979 අංක 49 දරන සංශෝධිත පනත යටතේ පිහිටුවන ලද්දකි.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ නෛතික හා ඓතිහාසික පසුබිම

1958 අංක 4 දරණ ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සංස්ථාපිත කර ඇත. ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පවරාදෙනු ලැබූ වතුයායන් හා රජය සතු වගා කළ ඉඩම් සංවර්ධනය කර නඟාසිටුවීමත් වගාව මනා ලෙස කළමනාකරණය කිරීමත් ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීමේ ප්‍රධාන අරමුණ විය. තව ද ඉඩම් කොමසාරිස්තුමා හා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්තුමා විසින් පවරා ගන්නා ලද වතුයායන් කළමනාකරණය කර පවත්වාගෙන යාමට පවරා දීම ද ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ස්ථාපිත කිරීමේ අරමුණක් විය.

ආරම්භයේදී රජය විසින් පවරා දෙන ලද වතුයායන් කීපයකින් ක්‍රියාත්මක වූ ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව බිහි කළ අරමුණ ඉතා හොඳින් ක්‍රියාත්මක කිරීම නිසා නොබෝ දිනකින්ම හෙක්ටයාර 15,000ක පමණ වතුයායන් මිල දී ගැනීමට හැකි විය. ශක්තිමක් පනතකින් ස්ථාපිතව ඒ අනුව, මනා කළමනාකරණයකින් පවත්වාගෙන යාම මේ වර්ධනයට හේතු විය.

එතෙක් හිමිකම සතු වූ වතුයායන් 25ක් පමණ කළමනාකරණය කරමින් සිටි ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ පනත හා 1975 සංශෝධිත පනත මඟින් ජනතාකරණය කරන ලද වතුයායන් හා එතෙක් පැවති භාරයන් අවලංගු වීම නිසා අත්පත් කර ගත් වතුයායන්ගෙන් වතුයායන් 250ක් පමණ සංවර්ධනය කර නඟාසිටුවීම සඳහා ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත භාර කර දෙන ලදී. එසේ පවරාගන්නා ලද අනෙකුත් වතුයායන් ජනතා වතු සංවර්ධන මණ්ඩලය බිහි කර එය වෙත පවරාදී ඇත.

විශාල වශයෙන් පුළුල් වී තිබූ ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව නඟාසිටුවීම සඳහා කළමනාකරණ ව්‍යුහය වෙනස් කිරීමට අවශ්‍යය විය. ඒ අනුව, වඩාත් කාර්යක්ෂම හා ඵලදායීව වතුයායන් කළමනාකරණය කිරීම සඳහා 1977දී බලයට පත් රජය ප්‍රාදේශීය කාර්යාල ස්ථාපිත කරන ලදී. ඒ අනුව, වතුයායන්හි පරිපාලනය විමධ්‍යගත විය.

ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත 1979 අංක 4 පනතින් සංශෝධනය වී ඇත. එහි 3වන වගන්තිය අනුව එතෙක් ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව නම් වූ නාමය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ලෙස සංශෝධනය විය.

තව ද, 1979 අංක 49 දරණ සංශෝධිත පනතේ අංක 6 වගන්තිය අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි අරමුණු වඩාත් පුළුල් විය. ඒ අනුව,

අ) වතුයායන්හි ඉඩම් කෘෂිකාර්මික ලෙස කළමණාකරණය කරමින් උපරිම ඵලදායීතාවයක් ලබාගැනීමට ප්‍රවර්ධනය කිරීම.

ආ) භූමියේ පවතින වගාවන් පුනරුත්ථාපනය කරමින් මනා කළමණාකරණයකින් හා සම්බන්ධීකරණයකින් යුතුව කෘෂිකාර්මික බෝග විවිධාංගීකරණය කිරීම.

ඇ) කෘෂිකාර්මික නිෂ්පාදන සැකසීම හා විකිණීම.

ඈ) වතුයායන්හි සත්ත්ව පාලනය නඟාසිටුවීම.

ඉ) වතුයායන්හි කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍යය යන්ත්‍ර උපකරණ ස්ථාපිත කර හොඳින් නඩත්තු කර පවත්වාගෙන යාම.

ඊ) වැවිලි සංස්ථාවේ සාධනීය ක්‍රියාකාරීත්වය හා කළමනාකාරීත්වය සඳහා අවශ්‍යය සියලු ක්‍රියාමාර්ග හා කාර්යයන් සිදු කිරීම.

ලෙස දැක්විය හැකිය.

1980 වසරේදී, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතුයායන්හි කළමනාකරණය ශක්තිමත් කිරීම හා විමධ්‍යගත සංවිධානාත්මක ව්‍යුහය ස්ථාවර කිරීම සඳහා පියවර ගණනාවක් ගන්නා ලදී. ඒ අනුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබූ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතට පත්වී ඇත. 1980 පෙබරවාරි මස ප්‍රාදේශීය කාර්යාලවල කාර්යය සාධනය ඉහළ නැංවීම සඳහා වඩාත් බලතල සහිත ප්‍රාදේශීය මණ්ඩල හතරක් පිහිටුවන ලදී. ඒවා S.L.S.P.C. I, II, III හා IV නම් විය. 1984 වසරේදී මෙම කාර්යය වඩාත් පුළුල් කරමින් බලංගොඩ හා මාතලේ අවට වතුයායන්හි මනා කළමනාකාරීත්වය සඳහා තවත් මණ්ඩල දෙකක් S.L.S.P.C. V හා VI වශයෙන් පිහිටුවන ලදී. මෙසේ වතුයායන්හි කළමනාකරණය විමධ්‍යගත කළ ද ප්‍රතිපත්ති සම්පාදනය, අලෙවිකරණය, ගබඩාකරණය හා මූල්‍ය කටයුතු ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කොළඹ පිහිටි මධ්‍යම මණ්ඩලය මඟින් සිදු කෙරිණි.

මෙම ප්‍රතිසංස්කරණවල අකාර්යක්ෂමතාව ඵලදායීතාව අඩුබව ප්‍රත්‍යක්ෂ වීමෙන් අනතුරුව එවකට පැවති රජය විසින් ‘‘රාජ්‍ය සංස්ථා හෝ රාජ්‍ය දේපොළ සතු ව්‍යාපාරික ආයතන රාජ්‍ය සමාගම් බවට පත්කිරීමේ පනත’’ යටතේ ප්‍රාදේශීය වැවිලි සමාගම් 22ක් 1992 වසරේදී ස්ථාපනය කරන ලදී. එම ප්‍රාදේශීය වැවිලි සමාගම් 22ට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ලාභ ලබන හා කෘෂිකාර්මික වශයෙන් ඉහළ ඵලදායීතාවයක් පෙන්නුම් කරන වතුයායන් 402ක කළමනාකාරීත්වය දීර්ඝ කාලීනව බදු පදනම මත පවරා දෙන ලදී. කලක් තිස්සේ පාඩු ලැබූ මෙන්ම උඩරට හා පහතරට තේවල ඇති ලාක්ෂණික ගුණාංග දක්නට නොමැති නිසා අඩු විකුණුම් මිලක් සහිත මැදරට තේ නිපදවන වතුයායන් 55ක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට හා ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ඉතිරි විය. මෙම වතුයායන් 55න් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට වතුයායන් 32ක් ඉතිරි විය. මෙම වතුයායන් 32න් ද වතුයායන් 11ක් සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගමට 1993දී පවරා දෙන ලදී. ඒ අනුව, ඉතිරි වූ වතුයායන් 21 ඒකාබද්ධ කර වතුයායන් 16ක් ලෙස පත්කර ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යටතට පත්කරන ලදී. මෙම වතුයායන් 16හි විශාල බිම් ප්‍රමාණයක් පැරණි බීජ තේවලින් යුක්ත වන අතර මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කයන්හි නකල්ස් කඳු පංතිය වටා පිහිටි දළ බෑවුම් සහිත දුර්වල පාංශු තට්ටුවකින් යුක්තය. ඒ නිසා මෙම මැදරට වතුයායන්හි අමු දළු අස්වැන්න ස්වාභාවිකවම ඉතා අඩු අගයක් ගන්නා ලදී. විකුණුම් මිල අඩුවීමත් අස්වැන්න අඩුවීමත් යන කාරණා තුනම හේතුවෙන් මෙම ප්‍රදේශයේ වතුයායන් කාලයක් තිස්සේ පාඩු ලබන වතුයායන් ලෙස හඳුන්වනු ලබයි.

එමෙන්ම, 1992 වසරේදී ශ්‍රී රාජ්‍ය වැවිලි සංස්ථාවේ සමස්ත කාර්ය මණ්ඩලය විශ්‍රාම ගන්වා සියලු මෙහෙයුම් නවතා ඇත. 1994 වසරේදී නව කාර්යය මණ්ඩලයක් බඳවාගෙන නැවත මෙහෙයුම් අරඹන ලදී. එතැන් පටන් 2006 වසර දක්වා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විෂය පථය යටතට ද පමුණුවා තිබුණි. වර්ෂ 2001 සිට 2004 දක්වා කාලය තුළදී පාඩු ලබන මෙම සංස්ථාව රජයට බරක් වශයෙන් සලකනු ලැබූ අතර, එසේ රජයට බරක්වීම අවම කර ගැනීමේ අරමුණෙන් ඇතැම් වතුයායන් හා වත්කම් දීර්ඝ කාලීන ලෙස බදු දී ඇත.

ආයෝජන මණ්ඩලයේ නිර්දේශ මත ඇතැම් ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශයට බදු දෙන ලද වෛතලාව, වූඩ්සයිඩ් හා හෙයාර්පාර්ක් යන වතුයායන් හා කොටගහ කර්මාන්තශාලාව ආදී ව්‍යාපෘති අසාර්ථක වූ බැවින් ඒවා බදු ගත් පාර්ශව විසින් අත්හැර දමන ලදී. පසුව වගකීම් රාශියක් සමඟ හෙයාර්පාර්ක් වතුයාය හා කොටගහ කර්මාන්තශාලාව ආපසු පවරා ගැනීමට රාජ්‍ය වැවිලි සංස්ථාවට සිදුවිය. අයහපත් කළමනාකාරීත්වය නිසා අරාජික වූ හෙයාර්පාර්ක් වතුයායේ අනවසර අත්පත් කර ගැනීම් හා වගාව නඩත්තු නොකිරීම නිසා වතුයාය වඩාත් පාඩු ලබන තත්ත්වයට පත්වී තිබුණි. වෛතලාව හා වූඩ්සයිඩ් වතුයායන් පසුව වෙනත් පෞද්ගලික සමාගමකට පවරා දෙන ලදී. එම සමාගම විසින් එම වතුයායන් වැරදි ලෙස කළමනාකරණය කිරීම හේතුවෙන් වූඩ්සයිඩ් වත්ත අතහැර දමා වෛතලාව වත්ත පමණක් සිය පාලනය යටතේ තබා ගන්නා ලදී.

2006 වසරේදී රජයේ ප්‍රතිපත්තිය වෙනස් වූ අතර ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විෂය පථයෙන් ඉවත් කර උපායමාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනයේ විෂය පථය යටතට ගෙන එය වාණිජමය වශයෙන් ශක්තිමත් රජයේ උපායමාර්ගික සංවිධානයක් වශයෙන් කළමනාකරණ කිරීමේ නව ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී. මෙම වතුයායන් හුදෙක් තේ වගාවක්

වශයෙන් පාලනය කිරීමේ ක්‍රමවේදය උපායමාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනයේ මැදිහත්වීම මත වෙනස් කරනු ලැබීය. ඒ අනුව, වතුයායන්හි වත්කම් කළමනාකරණය කිරීමේ නව සංකල්පය යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වත්කම් එනම්, රුපියල් මිලියන 3,000ක් පමණ වටිනා අගනා දැව සම්පත, කුඩා ජල විදුලි බලාගාර ඉදිකිරීමට ශක්‍යතාවක් ඇති ස්ථාන, වතුයායන්හි කාබන් තිර කිරීම ගණනය කර විකිණීම හා පාඩු ලබන වතුයායන්හි බෝග විවිධාංගීකරණය වැනි නොයෙකුත් ක්‍රමෝපායන් හඳුනාගන්නා ලදී.

2007 වසරේදී නකල්ස් ලෝක උරුමය ගැසට් කිරීමත් සමඟ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වතුයායන්හි විශාල භූමි භාගයක් ලෝක උරුමයට නතුවිය. ඒ අනුව, වාණිජ වන වගාවන්, එනසාල් වගා කළ බිම් මෙන්ම තේ වගා කළ බිම් ද නකල්ස් රක්ෂිතයට එක් විය. නමුත් රක්ෂිතයට එක් වූ භූමි ප්‍රමාණය හා මායිම් නිශ්චිත නොවීම නිසා වතුයායන්හි කළමනාකරණය හා රක්ෂිතය කළමනාකරණය ද ගැටලු සහගත විය. පසුව නකල්ස් ලෝක උරුම ස්වාරක්ෂක කලාපය ද ගැසට් කිරීමත් සමඟ තත්ත්වය තවත් ව්‍යාකූල විය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වඩාත් ආකර්ෂණීය ස්ථාන

කැලෑබොක්ක **360^0** වීව් පොයින්ට්





කැලෑබොක්ක 360^0 වීව් පොයින්ට් (උස: මීටර් 1,175) ප්‍රවනතා ගමනාන්තයක් බවට පත් විය. කඳු මුදුන මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්කවල මායිමේ පිහිටා ඇති අතර හත්ලේ කුඩා ලෝකාන්තය සහ හුන්නස්ගිරිය කන්ද සෑදෙන එකම කඳු මුදුන බෙදා ගනී. කඳුවැටිය උතුරට විහිදෙන අතර නකල්ස්හි බටහිර ස්කන්ධය සමඟ සම්බන්ධ වේ. පැහැදිලි දිනයක, නරඹන්නන්ට මධ්‍යම කඳුකරය, මහනුවර නගරය, සෙම්බුවත්ත වැව සහ නකල්ස් කඳුකරය නිරීක්ෂණය කළහැකි ආකර්ෂණීය ස්ථානයකි.

අමුත්තන්ට නවාතැන් ගැනීමට කඳවුරු බිමක් සහ වතු බංගලා 02ක් ඇත. පැතලි කඳු මුදුනේ මැද භාගයේ නිම කරන ලද හින්දු සිද්ධස්ථානයක් සහ දර්ශන භුක්ති විඳීමට කූරු භාවිතයෙන් සාදන ලද පැල්පතක් ඇත. දහවල් කාලයේදී ප්‍රදේශය ආවරණය වන පරිදි මීදුම නිසා බාධාවකින් තොරව දර්ශන භුක්ති විඳීමට උදෑසන සංචාරය කිරීම වඩා යෝග්‍ය වේ.

බර්න්සයිඩ්





මහනුවර පිහිටා ඇති, බර්න්සයිඩ් බංගලාව රංගල පොල්ගොල්ල ජලාශයේ සී ප්ලේන් ගුවන් තොටුපළේ සිට සැතපුම් 13 ක් දුරින් පිහිටා ඇති ආකර්ෂණීය ස්ථානයකි.

දන්කන්ද වැව - මිඩ්ලන්ඩ්ස්





දර්ශනීය දන්කන්ද වැව මධ්‍යම පළාතේ ජලාශයක් වන අතර එහි උස මීටර් 957 කි. මෙම දන්කන්ද වැව, කිරිමැටියාරන්ද සහ දංකන්දවත්තට ආසන්නව සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු මිඩ්ලන්ඩ්ස් වතුයායට නුදුරින් පිහිටා ඇත.

හුන්නස්ගිරිය







මහනුවර නගරයේ සිට කිලෝමීටර 22ක දුරින් හා මාතලේ දිස්ත්‍රික්කයේ ඇල්කඩුව ගම්මානයට ආසන්නයේ පිහිටි නකල්ස් කඳු පංතියත් හුන්නස් ෆෝල්ස් දිය ඇල්ලත් දෙස් විදෙස් සංචාරකයින්ගේ සිත්ගත් ආකර්ෂණීය ස්ථානයකි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය මඟින් මෙම දිය ඇල්ල නැරඹීමට පැමිණෙන සංචාරකයින් සඳහා පහසුකම් සලසා දී ඇත.

වැවතැන්න - වූඩ්සයිඩ්



වැවතැන්න කඳවුරු භූමිය, මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයෙහි මැද මහනුවර ප්‍රදේශයේ පිහිටා ඇති වූඩ්සයිඩ් රාජ්‍ය වතුයායෙහි පිහිටා ඇති අතර මහනුවර නගරයේ සිට කිලෝමීටර 37.9ක දුරින් පිහිටා ඇත. මෙම සුන්දර කඳවුරු භූමිය වෙත යන මාවත තරමක් දුෂ්කර වුව ද එය ඉතා සුන්දර අත්දැකීම් බහුල ගමනකි. මහනුවර සිට වැවතැන්න දක්වා යන අතරමඟ දී විස්මිත සහ ලෝක ප්‍රසිද්ධ වික්ටෝරියා ඩෑම් හමුවීම ද තවත් අපූර්වත්වයකි.

2018 වර්ෂය තුළ ශ්‍රී රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් පාලනය වන වතුයායන්හි තත්ත්වය

2018 වර්ෂය අරම්භ වන විට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් කළමනාකරණය කරන ලද වතුයායන් 14ක් විය. ඉන් 13ක් මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කය තුළ ද වලහන්දුව වතුයාය ගාල්ල දිස්ත්‍රික්කය තුළ ද පිහිටා ඇත.

වගුව 01- වතුයායන්හි විස්තර

වතුයායෙහි නම	මුළු භූමි ප්‍රමාණය (හෙක්ටයාර)	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
අලකොළ	819.86	මහනුවර	පන්විල
කොටගහ	1,059.31	මහනුවර	මැදදුම්බර
ගල්පිල්ල	765.89	මහනුවර	පන්විල/මැණික්හින්න
ගෝමර	731.13	මහනුවර	පන්විල තෙල්දෙණිය
හාගල	449.49	මහනුවර	පන්විල
හෙයාර්පාර්ක්	976.75	මහනුවර	උඩුදුම්බර
හුන්නස්ගිරිය	739.72	මාතලේ	උකුවෙල,පහතදුම්බර
කැලෑබොක්ක	1,370.36	මහනුවර	පන්විල,කයිකාවල
මිඩිලන්ඩ්	1,221.31	මාතලේ	රත්තොට
නිකොළොය	332.41	මාතලේ	රත්තොට
ඔපල්ගල	766.00	මාතලේ	අඹන්ගහකෝරළේ
රංගල	630.60	මහනුවර	මැදදුම්බර
වෛතලාව	556.48	මහනුවර	මැදදුම්බර
වලහන්දුව	100.22	ගාල්ල	අක්මීමණ
මුළු එකතුව	**10,519.53**		

2017 වර්ෂයේදී පෞද්ගලික අංශයට බදු දී තිබූ නිසි කළමනාකරණයකින් තොරව අත්හැර දමා තිබූ වෛතලාව වතුයායේ පාලනය නැවතත් සංස්ථාවේ පාලනය යටතට ලබා ගෙන තිබුණි. එහෙත් එහි නිසි පරිදි බදු ගිවිසුම් අවලංගු කිරීම් හා සේවක පරිපාලනයන් පිළිබඳ ගැටළු නිරාකරණය වීම සිදුකර නොතිබුණි. පවරා ගැනීමට කටයුතු කර තිබුණ ද, පවරා ගැනීමෙන් අනතුරුව එහි කළමනාකරණය කළ යුතු ආකාරය පිළිබඳ සැලැස්මක් ඉදිරිපත් වී ඇති බවත් දැන ගත නොහැකි විය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි ඉඩම් හා වතුයායන් පිළිබඳ සාරාංශය

වගුව 02- ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් මිල දී ගත් වතුයායන් පිළිබඳ සාරාංශය

වතුයාය	මිල දී ගත් දිනය	භූමි ප්‍රමාණය (හෙක්ටයාර)
හපුගස්තැන්න	1/1/1972	1,709.31
අළුපොළ	1/1/1972	1,228.74
ගලබොඩ	1/1/1972	376.92
හල්ගොල්ල	1/1/1972	1,006.88
රාස්සගල	1/1/1972	776.49
වික්ලිය	1/1/1972	805.67
තිස්පනේ	1/1/1972	384.62
මැද්දේකන්ද	1/1/1972	676.11
සොගම	1/1/1972	476.11
මතුරට	15/05/1975	278.54
ඔඩුවෙල	1/6/1973	659.51
අයිස්ලැබ්	26/11/1973	382.59
වෙදමුල්ල	1/9/1973	484.62
රම්බොඩ	1/9/1973	765.18
ග්‍රේට්වැලි	1/1/1974	320.24
දකුණු මැදදුම්බර	1/2/1974	505.26
කැරොලිනා	1/7/1974	1,063.56
ගල්ලේබොද්ද	1/7/1974	752.63
ගෙතන්ට්	1/7/1974	203.24
සෙනට් හේලියර්	1/7/1974	172.87
රොහැම්ප්ටන්	15/3/1974	100.61
නන්පේරියල්	11/4/1974	203.64
උඩපොළ	27/5/1975	278.54
ඩෙල්කිත්	19/5/1975	1,223.38
ඇල්පිටිය	1/6/1975	785.02
ගලහ-සිලික් ප්‍රොජෙක්ට්	1/7/1975	694.33
හොටිවිල්	1/7/1975	412.15
කැම්පියන්	1/7/1975	848.99
ඇහැලියගොඩ	1/8/1975	410.93
සපුමල්කන්ද	1/8/1975	646.96
දියදාව		280.57
මුළු එකතුව		**18,914.21**

වගුව 03 - රජයේ විවිධ ආයතන හරහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත ලැබුණු වතුයායන් පිළිබඳ සාරාංශය

වතුයාය	ලැබුණු ආකාරය	ලැබුණු දිනය	භූමි ප්‍රමාණය (හෙක්ටයාර)
හිග්ගොඩ	ඉඩම් කොමසාරිස්	1/10/1960	319.81
රදෙල්ල	දේශීය ආදායම් කොමසාරිස්	1/10/1960	633.60
යටවත්ත	දේශීය ආදායම් කොමසාරිස්	1/10/1960	522.67
නෙලිඋල	දේශීය ආදායම් කොමසාරිස්	1/10/1960	337.65
පල්ලේකැලේ	ඉඩම් කොමසාරිස්	1/1/1968	1270.04
මුළු එකතුව			**3083.77**

වගුව 04 - ගැසට් මඟින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත ලැබුණු වතුයායන් පිළිබඳ සාරාංශය

ගැසට් අංකය	දිනය	ලැබුණු ආකාරය	වතුයායන් ගණන		නාමික වටිනාකමක් සහිත වතුයායන් ගණන
			ප්‍රාදේශීය වැවිලි සමාගම්	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව	
150/12	7/24/1981	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	38	0	නැත
181/12	2/27/1989		55	25	නැත
815/10	4/21/1994		122	1	123
195/6	5/31/1982		6	8	නැත
569/14	8/2/1989		3	0	නැත
571/14	8/14/1989		1	0	නැත
206/15	8/20/1982		0	1	නැත
230/12	2/2/1983		1	0	නැත
937/2	8/19/1996		8	0	නැත
157/13	4/3/1975	රජය	5	0	නැත
439/18	2/6/1987		0	1	නැත
මුළු එකතුව			**239**	**36**	

වතුයායන්හි භූමි පරිභෝජනය - 2018

වගුව 05 - වතුයායන්හි භූමි පරිභෝජනය

හෙක්ටයාර ප්‍රකාශය , ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව -2018																
වතුයාය	තේ වගා කළ ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර)					රබර් (හෙක්ටයාර)		සුළු අපනයන බෝග (හෙක්ටයාර)				දැව වගාව (හෙක්ටයාර)		ගොඩනැගිලි හා මාර්ග (හෙක්ටයාර)	වෙනත් (හෙක්ටයාර)	මුළු ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර)
	ආදායම සහිත තේ			තේ තවාන්	නැවත වගාව	පැරණි රබර් වගාව	රබර් නැවත වගාව	කරදමුංගු	කුරුඳු	කරාබුනැටි	වෙනත්	වාණිජ දැව	ඉන්ධන දැව			
	ඇට තේ	රිකිළි තේ	කොන්ත්‍රාත් පදනම මත දළු නෙලීමට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය													
අලකොළ	174.75	113.95	107.50	1.00	8.00	-	-	-	-	-	-	-	79.38	34.21	301.07	819.86
කොටගහ	255.46	33.92	141.11	0.40	3.00	-	-	70.69	-	-	-	-	24.14	75.78	454.81	1,059.31
ගල්පිල්ල	36.37	165.01	-	2.21	7.04	-	-	-	-	5.85	-	-	70.21	40.29	438.91	765.89
ගෝමර	104.85	116.73	128.61	-	9.00	-	-	74.80	-	-	-	-	44.50	141.17	111.47	731.13
හාගල	104.80	77.78	84.66	0.42	-	-	-	-	-	-	-	-	89.62	34.06	58.15	449.49
හෙයාර්පාර්ක්	172.50	-	175.50	-	-	-	-	55.00	-	-	-	-	-	52.75	521.00	976.75
හුන්නස්ගිරි	153.14	37.78	34.21	0.60	-	-	-	41.40	7.96	22.45	1.96	-	7.00	18.20	415.02	739.72
කැලැබොක්ක	203.97	304.24	190.43	1.21	17.50	-	-	147.81	-	-	12.50	-	350.46	96.37	45.87	1,370.36
මිඩ්ලන්ඩ්	104.42	117.41	57.17	1.34	8.00	-	-	240.79	-	25.00	3.00	-	208.84	68.24	387.10	1,221.31
නිකොළොය	-	47.14	2.43	-	2.25	-	-	48.32	-	-	6.07	-	18.00	6.07	202.13	332.41
ඔපල්ගල	36.10	48.90	55.90	1.80	-	54.00	-	138.00	6.00	10.00	15.50	-	86.00	70.00	243.80	766.00
රංගල	129.35	85.44	110.45	2.00	5.00	-	4.00	-	-	-	7.50	-	-	28.90	257.96	630.60
වෛතලාව	47.56	36.97	74.69	-	-	-	-	61.06	-	-		-	47.39	26.73	262.08	556.48
වලහන්දුව	2.05	-	-	-	1.00	65.47	4.00	-	4.00	-	7.40	-	-	-	16.30	100.22
එකතුව	**1,525.32**	**1,185.27**	**1,162.66**	**10.98**	**60.79**	**119.47**	**8.00**	**877.87**	**17.96**	**63.30**	**53.93**	**-**	**1,025.54**	**692.77**	**3,715.67**	**10,519.53**

වතුයාන්හි ප්‍රධාන ආදායම් භෝගය වන තේ හා රබර් අස්වැන්න 2009-2018

වගුව 06- වතුයායන්හි ප්‍රධාන අදායම් භෝගය වන තේ හා රබර් අස්වැන්න 2009-2018

වතුයාය	තේ -අමු දළු (කිලෝග්‍රෑම්)									
	2009	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018
අලකොළ	956,041	1,065,220	1,077,059	952,633	880,458	769,499	787,217	705,364	759,745	734,923
කොටගඟ	356,674	352,166	312,648	370,453	258,308	194,663	216,383	170,940	205,002	293,452
ගල්පීල්ල	969,169	1,003,481	971,105	879,545	880,379	665,646	690,856	675,717	775,779	790,235
ගෝමර	575,125	602,682	647,939	566,360	574,639	486,583	547,711	667,328	764,337	743,270
හාගල	942,834	981,330	985,357	843,579	774,142	682,702	682,097	429,360	482,980	547,672
හෙයාර්පාර්ක්	572,622	543,660	455,650	399,609	463,485	375,497	298,837	229,330	252,911	298,088
හුන්නස්ගිරිය	553,458	651,682	370,875	737,337	520,190	431,449	578,320	515,374	528,226	496,959
කැලෑබොක්ක	1,777,245	1,943,439	2,153,655	2,006,814	1,762,933	1,331,815	1,608,769	1,373,408	1,382,689	1,468,809
මිඩ්ලන්ඩ්	1,054,461	1,145,480	998,500	669,558	730,241	395,511	586,442	438,614	503,015	586,207
නිකොළොය ****	300,009					458	1,122	1,550	2,979	159,993
ඔපල්ගල	394,644	421,186	369,534	369,158	430,719	297,287	301,755	247,751	305,494	354,023
රංගල	985,938	1,024,601	948,550	739,211	658,274	521,922	678,266	604,332	492,346	606,262
වෛතලාව***										228,362
වුඩ්සයිඩ**										22,153
එකතුව	**9,438,220**	**9,734,927**	**9,290,872**	**8,534,257**	**7,933,768**	**6,153,032**	**6,977,775**	**6,059,068**	**6,455,503**	**7,330,409**

වතුයාය	*රබර් - ලේටෙක්ස් (කිලොග්‍රෑම්)									
	2009	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018
වලහන්දුව	53,350	50,163	49,332	39,218	44,861	40,140	36,809	37,522	42,470	33,395

****	නිකොළොය රාජ්‍ය වතුයාය 2010-2013 සිට මිඩ්ලන්ඩ්ස් සමග ඒකාබද්ධ කෙරිණි
***	වෛතලාව රාජ්‍ය වතුයාය 2008-2017 සිට මරුති සමාගම විසින් කළමනාකරණය කෙරේ
**	2018 වර්ෂයට පෙර, වුඩ්සයිඩ් වතුයාය පිටතට පවරා දී තිබුණි
*	රබර් කිරිවල DRC අගය කිලෝග්‍රෑම් වලට පරිවර්තනය කර ඇත (Dry Rubber Content)

වතුයායන්හි හෙක්ටයාර එකකට ලබාගත් අමුදළු අස්වැන්න වර්ෂ 2009 - 2018

වගුව 07 - වතුයායන්හි හෙක්ටයාර එකකට ලබා ගත් අමු දළු අස්වැන්න 2009-2018

වතුයාය	අමු තේ දළු ප්‍රමාණය - හෙක්ටයාරයට කිලෝග්‍රෑම්									
	2009	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018
අලකොළ	2,328	2,828	3,070	2,856	2,660	2,321	2,293	2,121	2,479	2,367
කොටගඟ	1,494	1,523	1,353	1,316	1,400	1,060	860	819	935	930
ගල්පීල්ල	3,696	4,228	5,088	4,009	3,819	2,926	2,981	2,916	3,656	3,901
ගෝමර	2,746	2,958	3,772	3,474	3,363	3,121	3,363	3,084	3,451	3,139
හාගල	2,454	2,781	2,851	3,595	3,223	2,772	2,716	2,447	2,781	2,883
හෙයාර්පාර්ක්	1,823	1,807	1,633	1,274	1,633	1,274	995	674	795	1,260
හුන්නස්ගිරිය	2,651	3,242	3,474	3,321	2,828	2,181	2,744	2,749	2,823	2,599
කැලැබොක්ක	2,414	2,791	3,795	3,479	3,079	2,353	2,828	2,888	2,777	2,651
මිඩ්ලන්ඩ්	2,736	3,088	2,851	2,498	2,460	2,084	2,167	1,995	2,293	2,585
නිකොළොය	2,410					1,772	1,702	2,544	2,884	3,218
ඔපල්ගල	3,339	3,791	3,228	3,619	3,972	2,944	2,814	2,309	2,940	4,013
රංගල	3,072	3,456	367	3,772	3,256	2,553	3,247	2,916	2,316	2,581
වෛතලාව										2,688
එකතුව	31,162	32,493	31,484	33,214	31,693	27,363	28,712	27,463	30,130	34,815

වතුයාය	* රබර් ලේටෙක්ස් - හෙක්ටයාරයට කිලෝග්‍රෑම්									
	2009	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018
වලහන්දුව	821	776	763	603	690	618	566	577	649	510



*රූපය **03:** හෙක්ටයාර එකකට අමු තේ දළු අස්වැන්න (2009-2018)*



*රූපය **04:** හෙක්ටයාර එකකට රබර් අස්වැන්න (2009-2018)*

බටහිර මධ්‍යම කලාපයේ 2018 වසරේ වාර්ෂික වර්ෂාපතනය

වගුව 08- බටහිර මධ්‍යම කලාපයේ 2018 වසරේ වාර්ෂික වර්ෂාපතනය

වාර්ෂික වර්ෂාපතනය - 2018	
වතුයාය	**වර්ෂාපතනය (මි.මී.)**
අලකොළ	2792
කොටගඟ	2403
ගල්පිල්ල	1973
ගෝමර	2944
භාගල	2362
හෙයාර්පාර්ක්	3037
හුන්නස්ගිරිය	1674
කැලෑබොක්ක	3509
මිඩ්ලන්ඩ්	3588
නිකොළොය	2508
ඔපල්ගල	2161
රංගල	3134
වෛතලාව	2250

ඉහත දත්ත අනුව 2018 වර්ෂය පුරා විහිදුන හොඳ වර්ෂාපතනයක් බටහිර මධ්‍යම කලාපයේ පැවති ඇති අතර ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පොහොර ටොන් 229ක් වතුයායන් සඳහා භාවිතා කර ඇත.

පසුගිය වර්ෂ තුන සඳහා පොහොර භාවිතය

සමස්තයක් ලෙස සැලකිය යුතු මූල්‍ය සහනයන් ලැබී ඇත. එහෙත් කළමනාකරණය විසින් කෘෂිකාර්මික අවශ්‍යතාවක් ලෙස පොහොර හා වල්නාශක නිසි පරිදි ලබාදීමට අපොහොසත් වී ඇති බව පෙනී යයි.

වගුව 09- පසුගිය වර්ෂ තුන සඳහා පොහොර භාවිතය

වර්ෂය	භාවිතා කළ පොහොර ප්‍රමාණය (මෙ.ටොන්)	පොහොර පිරිවැය (රු.)	භාවිත කළ වල් නාශක ප්‍රමාණය (ලීටර/කිලෝ)	වල් නාශක පිරිවැය (රු.)
2016	67	3,283,300.00	800 kg 3340 l	5,959,464.00
2017	306	15,918,300.00	400 kg 1628 l	7,352,984.00
2018	229	7,530,941.60	3347 l	14,308,425.00

2018 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් නිෂ්පාදනය කරනු ලැබූ අමු දළු කිලෝ ග්‍රෑම් එකක විකුණුම් මිල රුපියල් 84.78ක් වූ අතර බටහිර මධ්‍යම කලාපයේ අමු දළු කිලෝ ග්‍රෑම් එකක විකුණුම් මිල රුපියල් 76.32ක් විය. ඒ අනුව, 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ විකුණුම් අනුපාතය, බටහිර මධ්‍යම කලාපයේ විකුණුම් අනුපාතයට වඩා 8.46කින් වැඩි අගයක පවත්වා ගෙන ඇත.

වසර තුනක් සඳහා වැවිලි සංස්ථාවේ අමු දළු කිලෝ ග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය

වගුව 10 - වසර තුනක් සඳහා සංස්ථාවේ අමු දළු කිලෝ ග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය

වර්ෂය	අමු තේ දළු කිලෝග්‍රෑමයකට නිෂ්පාදන පිරිවැය (රුපියල්)					
	දළු නෙලීම	ක්ෂේත්‍ර වැඩ	පොහොර	වල්නාශක	පොදු වියදම්	එකතුව
2016	32.48	10.07	1.80	5.70	46.28	96.32
2017	31.16	12.31	3.64	6.08	49.45	102.64
2018	32.44	13.24	2.59	7.84	45.96	102.07

ඒ අනුව, අමු දළු කිලෝ ග්‍රෑම් එකක නිෂ්පාදන වියදමෙන් පොහොර සඳහා වන වියදම අඩු අගයක් වේ. නිෂ්පාදන වියදමෙන් වැඩි පංගුවක් ගන්නා අමු දළු නෙලීමේ හා පොදු වියදම් කළමනාකරණය කිරීමෙන් තොරව පොහොර සඳහා වන ආයෝජනය පාලනය කිරීම තුළ අපේක්ෂිත අස්වැන්න අඩු වී ඇත. මෙම තත්ත්වය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පාලන අධිකාරිය හා කළමනාකාරීත්වය වටහා නොගැනීම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ දීර්ඝ කාලීන පාඩු ලැබීමට එක් හේතුවක් වී ඇත.

තේ නිෂ්පාදනය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව වර්තමානයේ තේ කර්මාන්තශාලා 10ක් ඇති අතර දැනට ක්‍රියාත්මක තත්ත්වයේ ඇත්තේ සී.ටී.සී. තේ කර්මාන්තශාලා 3ක් පමණි. කැලෑබොක්ක, මිඩ්ලන්ඩ්ස් හා රංගල යන එම තේ කර්මාන්තශාලා තුන මඟින් අප සංස්ථාවේ වතුයායන් කිහිපයක අමු දළු මඟින් නිමි තේ නිෂ්පාදනය කරන අතර එම නිෂ්පාදනයන්හි තත්ත්වය පහත වගුව මඟින් නිරූපණය කරයි.

වගුව 11 - තේ නිෂ්පාදනය

කර්මාන්තශාලාව	අමු තේ දළු (කි.ග්‍රෑම්)			නිමි තේ (කි.ග්‍රෑම්)			නිපදවූ නිමි තේ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස			නිෂ්පාදන පිරිවැය - කිලෝග්‍රෑම් එකකට රුපියල්			ශුද්ධ විකුණුම් සාමාන්‍ය - කිලෝග්‍රෑම් එකකට රුපියල්		
	2016	2017	2018	2016	2017	2018	2016	2017	2018	2016	2017	2018	2016	2017	2018
කැලෑබොක්ක	1,645,349	1,579,731	1,468,809	353,839	339,726	315,873	21.50	21.50	22.89	453.15	530.25	569.36	297.52	416.11	385.39
මිඩ්ලන්ඩ්	481,136	544,231	586,207	103,470	117,039	126,066	22.64	22.59	23.21	581.99	621.93	560.09	339.91	418.10	428.20
රංගල	626,639	497,796	606,262	134,761	107,053	130,379	22.29	21.78	21.82	465.43	653.12	592.84	356.54	479.13	412.44
එකතුව	**2,753,123**	**2,621,759**	**2,661,279**	**592,070**	**563,818**	**572,318**									





රූපය 05- නිමි තේ නිෂ්පාදනය (2016-2018)

වගුව 12- කර්මාන්තශාලා පිළිබඳ විස්තර

කර්මාන්තශාලාව	පිහිටි දිස්ත්‍රික්කය	නිෂ්පාදනය කරන තේ වර්ගය	ධාරිතාවය(කිලෝග්‍රෑම්)		වර්තමාන තත්ත්වය
			පෙරීම (Sifting)	මැළවීම (Withering)	
කොටගහ	මහනුවර	ඔතඩොක්ස්	1,290	6,000	අක්‍රිය
ගෝමර	මහනුවර	ඔතඩොක්ස්	8000 (සමස්ත ධාරිතාවය)		අක්‍රිය
හාගල	මහනුවර	ඔතඩොක්ස්	1,419	6,600	අක්‍රිය
හුන්නස්ගිරිය	මාතලේ	සීටීසී	1,720	8,000	අක්‍රිය
කැලැබොක්ක	මහනුවර	සීටීසී	12,000 (සමස්ත ධාරිතාවය)		ක්‍රියාත්මකයි
මිඩ්ලන්ඩ්	මාතලේ	සීටීසී	1,400	10,224	ක්‍රියාත්මකයි
දන්කන්ද	මාතලේ	ඔතඩොක්ස්	860	4,000	අක්‍රිය
නිකොළොය	මාතලේ	ඔතඩොක්ස්	645	3,000	අක්‍රිය
රංගල	මහනුවර	සීටීසී	1,500	7,000	ක්‍රියාත්මකයි

මිඩ්ලන්ඩ්ස් කර්මාන්තශාලාව මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි එකම සී.ටී.සී. තේ කර්මාන්තශාලාව වන අතර කැලැබොක්ක හා රංගල තේ කර්මාන්තශාලා මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

අප කර්මාන්තශාලාවන්හි නිෂ්පාදන පිරිවැය ඉතා ඉහළ අගයක් ගැනීම සහ අපගේ නිෂ්පාදන සඳහා ඉතා අඩු විකුණුම් මිලක් ලැබීම තුළ දිනෙන් දින ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව දැඩි මූල්‍ය අර්බුදයකට ලක් වී ඇත.

පළපුරුදු පුහුණු කළමනාකරණ හා අධීක්ෂණ කාර්ය මණ්ඩලයක් සහිත වැවිලි සංස්ථාවේ නිෂ්පාදිත අමු දළු හා නිමි තේ සඳහා මැදරට පවතින සාමාන්‍ය මිලටත් වඩා අඩු මිලක් ලැබීම කණගාටුදායක තත්ත්වයකි.



සංස්ථා තේ

දේශීය වෙළඳපොළට සංස්ථා තේ ලබා දීම තුළින් සංස්ථා තේ මිල, තේ වෙන්දේසිය තුළ උච්චාවචනය වීමෙන් ඇතිවන තාවකාලික මූල්‍ය අර්බුදයන්ට සහනයක් ලබා දීම පිණිස 2016 වර්ෂයේ නොවැම්බර් මස "සංස්ථා තේ" නිෂ්පාදනය ආරම්භ කරන ලදී.



2017 වර්ෂයේ මැද භාගයේ සාමාන්‍ය අගයක් පෙන්නුම් කළ සංස්ථා තේ වෙළඳපොළ, එම වර්ෂයේ අවසන් කාර්තුව වන විට උපරිම අගයක් පෙන්නුම් කරමින් වෙළඳපොළ කොටස ඉහළ අගයක් බවට පත් කර ගැනීමට සමත් වී තිබුණි. 2018 වර්ෂයේ මැද ඉහළ විකිණුම් අගයක් පෙන්නුම් කළ සංස්ථා තේ අළෙවිය, එම වර්ෂයේ අවසානයේ දී බලාපොරොත්තු වූ විකිණුම් ඉලක්ක කරා යාමට නොහැකි වුවත් 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂය අවසාන කාර්තුවේ දී වැඩි අළෙවි අගයක් පෙන්නුම් කරන ලදී.

වගුව 13: සංස්ථාතේ අළෙවිය - ප්‍රමාණාත්මක සංසන්දනය (2017-2018)

මාසය	අළෙවි වූ තේ ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	
	2017	2018
ජනවාරි	86.00	2539.70
පෙබරවාරි	100.00	2079.50
මාර්තු	1250.00	3947.65
අප්‍රේල්	553.00	2156.45
මැයි	1001.00	3369.60
ජූනි	1410.00	3502.15
ජූලි	1605.00	3379.45
අගෝස්තු	2186.00	4036.70
සැප්තැම්බර්	2036.75	3663.70
ඔක්තෝම්බර්	2221.05	2507.20
නොවැම්බර්	2232.70	2919.30
දෙසැම්බර්	3027.70	3493.80
එකතුව	17709.20	37595.20

වගුව 14: සංස්ථා තේ අළෙවි ආදායම (2017-2018)

මාසය	සංස්ථා තේ අළෙවි අදායම (රුපියල්)	
	2017	2018
ජනවාරි	49,000.00	1,717,815.75
පෙබරවාරි	72,433.00	1,488,562.75
මාර්තු	752,047.00	2,812,306.69
අප්‍රේල්	366,624.00	1,602,650.75
මැයි	672,188.75	2,418,044.32
ජූනි	1,083,306.75	2,609,889.00
ජූලි	1,158,942.80	3,098,106.25
අගෝස්තු	1,590,875.25	3,141,931.85
සැප්තැම්බර්	1,685,311.00	2,900,447.15
ඔක්තෝම්බර්	1,604,608.25	1,934,503.70
නොවැම්බර්	1,609,647.25	2,354,412.15
දෙසැම්බර්	2,159,990.25	2,877,599.25
එකතුව	12,804,974.30	28,956,269.61



රූපය 06: සංස්ථාගේ අළෙවිය - ප්‍රමාණාත්මක සංසන්දනය (2017-2018)

02



රූපය 07: සංස්ථා තේ අළෙවි ආදායම සංසන්දනාත්මකව (2017-2018)

රබර් නිෂ්පාදනය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව පවතිනුයේ එක් රබර් වතුයායක් පමණි. එය ගාල්ල දිස්ත්‍රික්කයේ වලහන්දුව ප්‍රදේශයේ පිහිටා ඇත. වර්ෂ තුනක් සඳහා මුළු රබර් කිරි නිෂ්පාදනය පහත වගුවෙන් නිරූපණය වේ.

වගුව 15 - වර්ෂ තුනක් සඳහා මුළු රබර් නිෂ්පාදනය

වර්ෂය	ලේටෙක්ස් (කි.ග්‍රෑ.)	මුළු වියදම (රු.)	ලාභය/(අලාභය) (රු.)	ශුද්ධ විකිණුම් අගය (රු.)	නිෂ්පාදන පිරිවැය කිලොග්‍රෑම් එකකට (රු.)	කිලෝග්‍රෑමයකට ලාභය/(අලාභය) (රු.)
2018	4,318	1,347,734.16	(397,747)	220.00	312.12	(92.12)
2017	42,470	5,617,931.60	(3,350,208)	123.85	132.28	(8.43)
2016	37,525	13,548,401.25	(5,221,271)	221.91	361.05	(139.14)



රූපය 08-රබර් නිෂ්පාදනය (2016-2018)



ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන ලද ප්‍රදානයන් පිළිබඳ සාරාංශය

පෙර වසර වලදී මෙන්ම මෙම වසරේදී ද මහා භාණ්ඩාරාගාරයෙන් වැටුප් හා එදිනෙදා වියදම් කළමනාකරණය කර ගැනීමට රුපියල් මිලියන 158ක මූල්‍ය ප්‍රදානයක් ලබාදී ඇත. වසර පහක මහා භාණ්ඩාගාරයෙන් ලබාදී ඇති මුදල් හා එහි භාවිතය පහත වගුවෙන් නිරූපණය වේ.

වගුව 16 - භාණ්ඩාගාර ප්‍රතිපාදන

අයිතමය	2014	2015	2016	2017	2018
මෙහෙයුම් වියදම් (කම්කරු වේතන සහ කාර්ය මණ්ඩල වැටුප්)	49	104	100	130	68
ව්‍යවස්ථාපිත ගෙවීම් (සේෂා/සේනිහාඅ/පාරිතෝෂික)	362	100	0	134	90
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සංවර්ධන කටයුතු	73	0	0	0	0
මුළු ලැබීම් (රු. මි.)	484	204	100	264	158



2018 වසරේ වාර්ෂික ඇස්තමේන්තුව සහ 2018 වර්ෂයේ ගිණුම් ප්‍රකාශය අනුව කාර්යසාධනය

වගුව 17- 2018 වර්ෂය සඳහා වර්ෂික ඇස්තමේන්තුව සහ 2018 වර්ෂයේ ගිණුම් ප්‍රකාශය අනුව කාර්යසාධනය

විස්තරය	2018 ඇස්තමේන්තුව	වාර්ෂික ගිණුම් - 2018	කාර්ය සාධනය	2017 ඇස්තමේන්තුව	වාර්ෂික ගිණුම් - 2017	කාර්ය සාධනය
සැකසූ තේ - නිෂ්පාදන පිරිවැය (C.O.P.)	425.88	445.58	104.63	382.65	473.64	123.78
- ශුද්ධ අලෙවි සාමාන්‍යය (N.S.A.)	450.94	371.22	82.32	309.34	419.28	135.54
රබර් - නිෂ්පාදන පිරිවැය (C.O.P.)	299.24	420.59	140.55	242.53	320.81	132.28
- ශුද්ධ අලෙවි සාමාන්‍යය (N.S.A.)	350.00	244.25	69.79	250.00	309.63	123.85
ඇස්තමේන්තුගත නිෂ්පාදනය - සැකසූ තේ (කිලෝ)	2,367,400	1,585,483	66.97	2,439,500	1,532,487	62.82
ඇස්තමේන්තුගත නිෂ්පාදනය - රබර් (කිලෝ)	45,500	33,395	73.40	55,200	42,472	76.94
ආදායම	**රු:**	**රු:**	**රු:**	**රු:**	**රු:**	**රු:**
සැකසූ තේ සහ තේ දළු	1,067,555,575	588,555,635	55.13	754,638,000	642,542,493	85.15
රබර් -ලේටෙක්ස්	15,925,000	8,156,688	51.22	13,800,000	13,150,501	95.29
මුළු ආදායම	1,083,480,575	596,712,323	55.07	768,438,000	655,692,994	85.33
අඩු කළා: නිෂ්පාදන පිරිවැය						
සැකසූ තේ සහ තේ දළු	1,008,236,601	706,455,462	70.07	933,479,468	725,853,020	77.76
රබර්	13,615,324	10,045,649	103.16	13,387,511	13,625,380	101.78
මුළු නිෂ්පාදන පිරිවැය	1,021,851,925	720,501,111	70.51	946,866,979	739,478,400	78.10
දළ ලාභය/(පාඩුව) - වතුයාය	61,628,650	(123,788,787)	(200.86)	(178,428,979)	(83,785,406)	46.96
එක් කළා: වෙනත් ආදායම්						
වෙනත් ආදායම් - වතුයාය	336,320,599	74,648,845	22.20	356,950,095	64,934,597	18.19
වෙනත් ආදායම් - ප්‍රධාන කාර්යාලය	88,371,690	42,098,097	47.64	47,355,000	44,529,539	94.03
මුළු වෙනත් ආදායම් - වතු සහ ප්‍රධාන කාර්යාලය	424,692,289	116,746,942	27.49	404,305,095	109,464,136	27.07
මුළු ආදායම	486,320,939	(7,041,846)	(1.45)	225,876,116	25,678,730	11.37
අඩු කළා: වියදම්						
පරිපාලන වියදම් - වතුයාය	82,871,726	47,584,324	57.42	76,368,593	53,231,368	69.70
-ප්‍රධාන කාර්යාලය	26,170,569	35,189,977	134.46	20,836,402	20,065,142	96.30
පුද්ගල වියදම් - ප්‍රධාන කාර්යාලය	44,681,990	45,892,546	102.71	39,407,052	39,440,824	100.09
මූල්‍ය ගාස්තු - වතුයාය	6,826,282	4,694,004	68.76	6,114,324	4,480,462	73.28
-ප්‍රධාන කාර්යාලය	9,900,000	7,396,411	74.71	8,650,000	3,393,534	39.23
මුළු වියදම්	195,890,568	140,756,662	71.85	151,376,371	120,611,330	79.68
ලාභය/(පාඩුව) - වතු සහ ප්‍රධාන කාර්යාලය	**290,439,372**	**(147,798,507)**	**(50.89)**	**74,499,745**	**(94,932,600)**	**(127.43)**

****2017 ජනවාරි 5 දින ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලදී**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පසුගිය වර්ෂ 05 තුළ ලාභ/අලාභ

වගුව 18 - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පසුගිය වසර 05 තුළ ලාභ/අලාභ

වර්ෂය	ලාභ/අලාභ
2014	(177,215,397)
2015	(222,236,596)
2016	(150,916,820)
2017	(94,932,600)
2018	(147,798,507)



රූපය 09 - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පසුගිය වර්ෂ 05 තුළ ලාභ/අලාභ සංසන්දනය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු මානව සම්පත

2018 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කළමනාකරණ හා අධීක්ෂණ හා නිෂ්පාදන කාර්යය මණ්ඩලය පිළිබඳ පහත වගුවෙන් නිරූපණය වේ.

වගුව 19 - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මානව සම්පත

වතුයායේ නම	වතු අධිකාරීවරුන්	සහකාර වතු අධිකාරීවරුන්	කාර්යය මණ්ඩලය		කම්කරුවන්			එකතුව
			ස්ථීර	කොන්ත්‍රාත්	ස්ථීර	කොන්ත්‍රාත්		
අලකොළ	1	2	16	1	306	0		326
කොටගහ	1	1	14	1	187	0		204
ගල්පිල්ල	1	2	20		220	4		247
ගෝමර	1	2	16	2	279	11		311
හාගල	1	1	11	0	206	0		219
හෙයාර්පාර්ක්	1	1	11	0	137	2		152
හුන්නස්ගිරිය	1	1	18	0	217	0		237
කැලෑබොක්ක	1	4	36	1	760	32		834
මිඩ්ලන්ඩ්	1	2	19	1	268	0		291
නිකොළොය	1	0	7		61	0		69
ඔපල්ගල	1	0	13		80	0		94
රංගල	1	2	18	2	228	42		293
වෛතලාව	1		3	1	55	0		60
වලහන්දුව	1	1	5		54	7		68
ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාලය	0	0	49	13	0	0		62
එකතුව	**14**	**19**	**256**	**22**	**3058**	**98**		**3467**

2017 වර්ෂය ආරම්භයේදී ප්‍රධාන කාර්යාලයෙන් වැටුප් ලබන කාර්ය මණ්ඩලය 59ක් වූ අතර 2017 වර්ෂය අවසානය වන විට එය 60ක් විය. 2018 වර්ෂයේ එය 62ක් දක්වා වර්ධනය වී ඇත. 2017වර්ෂයේ මෙම කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම සඳහා රුපියල් මිලියන 33ක් වැයවී ඇති අතර එය 2018 වර්ෂයේදී රුපියල් මිලියන 6.7කින් එනම් 20.3%කින් වැඩි වී ඇත. මෙයට හේතුව වී ඇත්තේ අනුමත කාර්යය මණ්ඩලයෙන් බැහැර අවිධිමත් බඳවා ගැනීම් හා 2018 වර්ෂය අවසානයේ අවිධිමත් උසස්වීම් බව නිරීක්ෂණය වේ. 2018 වර්ෂයේ මානව සම්පත් සංවර්ධන අංශය විසින් කිසිදු අභ්‍යන්තර පුහුණු වැඩසටහනක් පවත්වා නොමැත.

2017 වර්ෂය ආරම්භයේදී වතුයායන්හි කාර්යාල හා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය 194ක් වූ අතර එම වර්ෂය අවසානයේදී එය 198ක් දක්වා වර්ධනය වී ඇත. 2018 වර්ෂයේදී එය නැවත 256 දක්වා වැඩි වී ඇත. 2017 වර්ෂයේදී මෙම කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීමට රුපියල් මිලියන 74.9ක් වැය වී ඇති අතර එය 2018 වර්ෂයේදී රුපියල් මිලියන 89.7ක් වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල හා විගණන කමිටු රැස්වීම්

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2018 මූල්‍ය ප්‍රකාශනය සඳහා ද රජයේ විගණකාධිපති අභිතකර මතයක් ලබාදී ඇත. මූල්‍ය ප්‍රකාශනය සඳහා රාජ්‍ය වැවිලි සංස්ථාවට දීර්ඝ කාලයක සිට අභිතකර මතයක් ඇති අතර මෙම වසරේදී ද එය නිවැරදි කර ගැනීමට නොහැකි වී ඇත.

සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 6ක් පවත්වා ඇති අතර විගණන කමිටු රැස්වීම් පවත්වා නොමැත.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

ශ්‍රී ලංකා රුපියල් වලින්.

දෙසැම්බර් 31 වන දිනට	**සටහන්**	**2018**	**2017**
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පැල සහ උපකරණ	8	756,206,267	750,687,203
ජීව විද්‍යාත්මක වත්කම්	9	3,466,853,617	3,459,074,142
ආයෝජන දේපල	10	1,611,520,641	1,611,520,641
ස්ථාවර තැන්පතු		8,532,777	8,188,992
නොනිමි ප්‍රාග්ධන වැඩ		-	335,347
විලම්බිත වත්කම්		781,064	1,128,930
ජංගම නොවන මුළු වත්කම්		**5,843,894,366**	**5,830,935,254**
ජංගම වත්කම්			
බඩු තොගය	11	48,241,155	25,182,454
වෙළඳ සහ අනෙකුත් අයවීම්	12	115,551,243	106,392,662
වෙනත් තැන්පතු	13	-	1,935,020
මුදල් සහ මුල්‍ය සමතුලනය	14	53,812,300	101,871,142
මුළු ජංගම වත්කම්		**217,604,698**	**235,381,278**
මුළු වත්කම්		**6,061,499,064**	**6,066,316,532**
ස්කනධ සහ බැරකම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
දායක ප්‍රාග්ධනය	15	5,657,852,850	5,499,852,851
රඳවාගත් ඉපැයුම්		(1,067,273,122)	(918,393,477)
මුළු ස්කන්ධ		**4,590,579,728**	**4,581,459,374**
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ වගකීම්	16	339,598,126	352,203,370
මුළු ජංගම නොවන වගකීම්		**339,598,126**	**352,203,370**
ජංගම වගකීම්			
වෙළඳ සහ අනෙකුත් ගෙවීම්	17	1,091,072,027	1,126,997,896
බැංකු අයිරාව		40,249,182	5,655,892
මුළු ජංගම වගකීම්		**1,131,321,209**	**1,132,653,788**
මුළු වගකීම්		**1,470,919,336**	**1,484,857,158**
මුළු ස්කන්ධ හා වගකීම්		**6,061,499,063**	**6,066,316,532**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බව යටින් අත්සන් කර ඇති අය විසින් සහතික කරනු ලබයි.

S.I.M. හසන් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

R.G.H.S.ගුණතිලක මයා
ගණකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ,

ශ්‍රීමාල් විජේසේකර මයා
සභාපති/ප්‍ර.වි.නි.

S.M.C.S. සිරිවර්ධන මයා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

G.R.S.සේනාරත්න මයා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2020 මැයි මස 22 වන දින, කොළඹ

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ආදායම් ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල් වලින්.

දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය	**සටහන්**	**2018**	**2017**
ආදායම	18	**597,950,423**	**662,528,772**
විකුණුම් මිල	20	(720,501,111)	(739,478,400)
දළ ලාභය / (අලාභය)		**(122,550,687)**	**(76,949,628)**
වෙනත් ආදායම්	19	115,508,842	102,628,358
පරිපාලන වියදම්	21	(128,666,247)	(112,737,334)
මෙහෙයුම් ලාභය / (අලාභය)		**(135,708,092)**	**(87,058,604)**
මූල්‍ය වියදම්	22	(12,090,415)	(7,873,996)
කාල සීමාව සඳහා ලාභය/ (අලාභය)		**(147,798,507)**	**(94,932,600)**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල් වලින්.

2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය

	ප්‍රාග්ධනය	ඉඩම් දායකත්වය	සංචිත ආදායම (අඩුවීම)	එකතුව
2017 ජනවාරි 01 දිනට ශේෂය	3,015,250,925	2,220,601,926	(755,362,392)	4,480,490,459
භාණ්ඩාගාරයෙන් ලැබුණු ආධාර	264,000,000	-	-	264,000,000
වර්ෂයට අදාළ අලාභය	-	-	(94,932,600)	(94,932,600)
පූර්ව වර්ෂය හා ගැලපුම් (සටහන 26)	-	-	(68,098,890)	(68,098,890)
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	**3,279,250,925**	**2,220,601,926**	**(918,393,882)**	**4,581,458,969**
2018 ජනවාරි 01 දිනට ශේෂය	3,279,250,925	2,220,601,926	(918,393,477)	4,581,459,374
භාණ්ඩාගාරයෙන් ලැබුණු ආධාර	158,000,000	-	-	158,000,000
වර්ෂයට අදාළ අලාභය	-	-	(147,798,507)	(147,798,507)
පූර්ව වර්ෂය හා ගැලපුම් (සටහන 26)	-	-	(1,081,138)	(1,081,138)
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**3,437,250,925**	**2,220,601,926**	**(1,067,273,122)**	**4,590,579,729**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල් වලින්.

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය	**සටහන්**	**2018**	**2017**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබුණු මුදල් ප්‍රවාහ			
බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය /(අලාභය).		**(147,798,507)**	**(94,932,600)**
පහත දැ සඳහා ගැලපුම්:			
ජීව විද්‍යාත්මක වත්කම් ක්ෂය වීම	9.2	3,333,614	3,185,380
වත්කම් ක්ෂය වීම	8	8,453,297	7,969,478
මාර්ග ප්‍රතිසංස්කරණ අරමුදල		-	148,078
මූල්‍ය වියදම්	21	12,090,415	7,873,996
පාරිතෝෂික දීමනා ප්‍රතිපාදන	16	25,853,232	36,159,924
ණය පොලී		(1,600,000)	(1,600,000)
විගණන ගාස්තු ප්‍රතිපාදන		208,000	534,630
රක්ෂණ ප්‍රතිපාදන		204,055	532,134
කළමනාකරණ ගාස්තු වියදම්		-	(172,409)
නිවාඩු වැටුප්,අධි ප්‍රතිපාදන		-	9,353,603
පූර්ව වර්ෂය හා ගැලපුම්	26	(1,240,487)	(69,698,890)
හඳුනාගත් හිඟය			-
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර ලාභය		**(100,496,382)**	**(97,446,676)**
කාරක ප්‍රාග්ධන වෙනස්කම්			
(වැඩිවීම) / ඉන්වෙන්ට්‍රිවල අඩුවීම		(23,058,700)	26,416,546
(වැඩිවීම) / වෙළඳාමේ අඩුවීම සහ අයවීම්		(9,158,581)	3,341,753
(වැඩිවීම) / අනෙකුත් තැන්පතුවල අඩුවීම		1,935,020	10,000
වත්මන් වගකීම් වැඩි කිරීම / (අඩු වීම).		(65,771,625)	(112,806,584)
මෙහෙයුම් වලින් උත්පාදිත මුදල්		**(96,053,886)**	**(180,484,962)**
වෙළඳ සහ අනෙකුත් අයවීම්			
පාරිතෝෂික ගෙවීම්		(9,024,774)	(43,727,764)
ගෙවන ලද මූල්‍ය පිරිවැය		(10,490,415)	(6,273,996)
භාණ්ඩාගාර ආධාර ලැබීම්		158,000,000	264,000,000
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය		**138,484,811**	**33,513,278**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබුණු මූල්‍ය ප්‍රවාහ			
දේපල, පිරියත සහ උපකරණ එකතු කිරීම්	8	(13,913,013)	(13,935,310)
ජීව විද්‍යාත්මක වත්කම් වලට එකතු කිරීම්	9.2	(11,013,089)	(10,363,351)
විලම්බිත වත්කම්		347,867	-
ප්‍රාග්ධන නොනිමි වැඩ තුළ ආයෝජනය		335,347	(256,690)
ස්ථාවර තැන්පතු තුළ ආයෝජනය		(343,785)	(757,992)
ආයෝජන ක්‍රියාකාරකම් තුළ භාවිතා කරන ශුද්ධ මුදල්		**(24,586,674)**	**(25,313,343)**
මුදල් සහ මුදල් සමාන දේවල වැඩි වීම / (අඩු වීම)		**(82,652,131)**	**8,199,935**
මුදල් සහ මුදල් සමතුලනවල වලනයන්			
කාලපරිච්ඡේදය ආරම්භයේ දී		96,215,249	88,015,314
වර්ෂය සඳහා වැඩි වීම/(අඩු වීම).		(82,652,131)	8,199,935
වර්ෂය අවසානයේ මුදල් සහ මූල්‍ය සමතුලනයන්		**13,563,118**	**96,215,249**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්

1. සංස්ථාපිත තොරතුරු

සාමාන්‍ය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, 1958 අංක 4 දරන පනත යටතේ සංස්ථාපනය කරන ලද, ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති රාජ්‍ය ආයතනයකි. එය, කොළඹ 12, මිරානියා විදිය, අංක 21 දරණ ස්ථානයෙහි පිහිටා ඇති රජයේ සංස්ථාවකි.

සංස්ථාව විසින් දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස දොළහක කාලසීමාවක් සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම මූල්‍ය ප්‍රකාශ බලාත්මක කරයි.

ප්‍රධාන ක්‍රියාකාරකම්

තේ නිෂ්පාදනය කිරීම හා තේ වෙන්දේසි කිරීම මඟින් සකස් කරන ලද තේ අලෙවි කිරීම, රබර් කිරි හා සුළු අපනයන භෝග (කරාබුනැටි, ගම්මිරිස්, කරඳමුංගු හා කුරුඳු යනාදිය) විකිණීම සහ සංස්ථාව මඟින් වාණිජමය දැව වගා කිරීම හා අලෙවි කිරීම.

2. මූල්‍ය වාර්තා සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මඟින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

සාධාරණ වටිනාකමට අගයන ලද ජීව විද්‍යාත්මක වත්කම් හැර, ඓතිහාසික පිරිවැය පදනමක් මත මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

3.1.1 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී සංස්ථාව විසින් පහත සඳහන් සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගනී.

3.1.2 දේපල, පිරියත හා උපකරණ

සමුච්චිත ක්ෂය කිරීම් හා සමුච්චිත හායන පාඩු ඇත්නම්, එවැනි හායන පාඩුවල ශුද්ධ පිරිවැයට දේපල, පිරියත හා උපකරණ දක්වා ඇත. එවැනි පිරිවැයක් තුල දේපල, පිරියත හා උපකරණවල ආංශික කොටස් ආදේශ කිරීමේ පිරිවැය සහ හඳුනාගැනීමේ පරිපාටිය සපුරාලන්නේ නම්, දිගුකාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණය ගැනීමේ පිරිවැය ඇතුලත් වේ. දේපල, පිරියත හා උපකරණවල සුවිශේෂී කොටස් අන්තරයක් සහිතව ආදේශ කිරීමට අවශ්‍යය වන්නේ නම්, සංස්ථාව එසේ ආදේශ කරන ලද කොටස හඳුනාගැනීමෙන් තොරව බැහැර කරන අතර, ඊට අදාල ප්‍රයෝජ්‍ය ආයුකාලයක් සහිත, ක්‍රමක්ෂය කළ හැකි නව කොටසක් හඳුනාගැනීමට ලක් කරයි. මේ හා සමානව, යම් ප්‍රධාන පෙලේ විමර්ශනය කිරීමක් සිදුකළහොත්, හඳුනාගැනීමේ පරිපාටිය සපුරාලන්නේ නම්, එහි පිරිවැය ආදේශකයක් ලෙස එම පිරියතේ හා උපකරණයෙහි ඉදිරියට ගෙන යනු ලබන වටිනාකම තුල හඳුනාගැනේ. අනෙකුත් සියලුම අලුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය හට ගත් පිරිවැය ලෙස මූල්‍ය ප්‍රකාශ තුල හඳුනාගැනේ.

3.1.3 ක්ෂය කිරීම

මිලදී ගත් දිනයේ සිට බැහැර කරන දිනය දක්වා වර්ෂය තුල අත්පත් කරගත් හා බැහැර කරන ලද දේපල පිරියත හා උපකරණ මත ක්ෂය කිරීම් සිදු කෙරේ.

ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය සහ දේපල පිරියත හා උපකරණවල ක්ෂය කිරීමේ අනුපාත පහත සඳහන් පරිදි වේ:

අයිතමය	ප්‍රයෝජ්‍ය ආයුකාලය	අනුපාතය
ගොඩනැඟිලි	අවුරුදු 20	5%
මෝටර් රථ	අවුරුදු 4	25%
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	අවුරුදු 8	12.5%
කාර්යාල උපකරණ	අවුරුදු 8	12.5%
යන්ත්‍ර	අවුරුදු 8	12.5%
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	අවුරුදු 3	33.33%

3.1.4 ජීවවිද්‍යාත්මක වත්කම්

ජීවවිද්‍යාත්මක වත්කම් යම් ජීවී සත්ත්වයෙකුට හෝ පැළෑටියකට අදාල වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41ට අනුව, ජීවවිද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් යම් පොදු ලක්ෂණ කිහිපයක් ඇත, එනම්, (අ) වෙනස් වීමට ඇති හැකියාව (ජීව විද්‍යාත්මක ලෙස පරිවර්තනය වීමේ හැකියාව) (ආ) වෙනස්වීම කළමනාකරණය කරගැනීම (එම ක්‍රියාවලිය සිදුවීම සඳහා අවශ්‍ය තත්ත්වයන් වැඩිදියුණු කිරීමෙන් ජීව විද්‍යාත්මක පරිවර්තනය වීම සඳහා කළමනාකරණය මඟින් පහසුකම් සලසයි. එවැනි කළමනාකරණයක් මඟින් කෘෂිකාර්මික කටයුතු වෙනත් කටයුතුවලින් වෙන් කර දක්වයි. උදාහරණයක් ලෙස, කළමනාකරණය නොකරන ලද මූලාශ්‍ර මඟින් අස්වැන්න ලබා ගැනීම) සහ (ඇ) වෙනස්වීම ගණනය කිරීම (ජීව විද්‍යාත්මක ලෙස පරිවර්තනය වීමේ හෝ එමඟින් ඇති වූ වෙනස දෛනික කළමනාකරණ කාර්යයක් ලෙස ගණනය කර, අධීක්ෂණය කෙරේ.)

ජීව විද්‍යාත්මක වත්කම්, ස්වයං ප්‍රතිජනන ජීව විද්‍යාත්මක වත්කම් (bearer biological assets) සහ පරිභෝජනය කළ හැකි ජීව විද්‍යාත්මක වත්කම් (consumable biological assets) ලෙස කොටස් දෙකකි.

3.1.4.1 ස්වයං ප්‍රතිජනන ජීව විද්‍යාත්මක වත්කම් (Bearer Biological Assets)

පරිභෝජනය කළ හැකි ජීව විද්‍යාත්මක වත්කම් හැර අන් වත්කම් ස්වයං ප්‍රතිජනන ජීව විද්‍යාත්මක වත්කම් වන අතර, සංස්ථාවට අදාලව තේ පඳුරු, රබර් ගස් හා ඕනෑම ක්ෂේත්‍ර වගාවක් වැනි ප්‍රධාන පෙලේ වැවිලි කටයුත්තක් ඊට අයත් විය හැකිය. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මඟින් ලබා දී ඇති විකල්පය පරිදි යම් සමුච්චිත ක්ෂය කිරීමක් හා යම් සමුච්චිත හායන පාඩුවක් අඩු කර ලැබෙන පිරිවැයට මෙහි අගය ඉදිරියට ගෙන යනු ලැබේ.

ස්වයං ප්‍රතිජනන ජීව විද්‍යාත්මක වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය පහත සඳහන් පරිදි වේ:

පොල්	අවුරුදු 25	කොකෝවා	අවුරුදු 20
ගම්මිරිස්	අවුරුදු 15	කුරුඳු	අවුරුදු 25
රබර්	අවුරුදු 35	සාදික්කා	අවුරුදු 30
කරාබුනැටි	අවුරුදු 50	නැවත වන වගාකිරීම	අවුරුදු 25
කෝපි	අවුරුදු 25	ඉඟුරු	අවුරුදු 01
පුවක්	අවුරුදු 40		

3.1.4.2 පරිභෝජනය කළ හැකි ජීව විද්‍යාත්මක වත්කම්

කෘෂිකාර්මික නිෂ්පාදිතයක් ලෙස අස්වැන්න ලබාගත හැකි හෝ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස අලෙවි කළ හැකි වත්කම් පරිභෝජනය කළ හැකි ජීව විද්‍යාත්මක වත්කම් වන අතර, ඊට දැව ඇතුලත් වේ. කෘෂිකාර්මික නිෂ්පාදිත වෙළඳපොලට රැගෙන යාම සඳහා අවශ්‍ය පිරිවැය සහ ඇස්තමේන්තුගත අලෙවි පිරිවැය අඩු කර ලැබෙන සාධාරණ වටිනාකමට මෙකී නිෂ්පාදිත අගය කෙරේ. ඇගයීම මත යම් ලාභයක් හෝ පාඩුවක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය යටතේ හඳුනාගැනේ.

3.1.4.3 කල් තබන ලද වත්කම්

කල් තබන ලද වත්කම් වාර්ෂිකව 10%ක අනුපාතයට ක්‍රමක්ෂය කෙරේ.

3.1.5 ආයෝජන දේපල

ප්‍රාග්ධන ඇගයීම සඳහා සහ/හෝ කුලී ආදායම් ඉපැයීම සඳහා තබාගත් දේපල ආයෝජන දේපල තුල අන්තර්ගත වේ. අදාල ගණුදෙණු පිරිවැය හා ඉන් අනතුරුව යම් දේපලකට එකතු කිරීම, යම් දේපලක් ආදේශ කිරීම හෝ අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් හටගත් පිරිවැය ඇතුලු පිරිවැයට මෙම දේපල මූලික වශයෙන් ගණනය කෙරේ. ඉන්පසුව සිදු කෙරෙන ගණනය කිරීම් ද සමුච්චිත ක්‍රමක්ෂය කිරීමෙන් අඩු කර ලැබෙන පිරිවැයට සිදු කෙරේ.

3.1.6 දැනට සිදු කරගෙන යන ප්‍රාග්ධන කාර්යයන් (Capital work in progress)

වර්ෂය තුල හට ගත්, එහෙත් ශේෂ පත්‍රය සකස් කරන දිනට ප්‍රාග්ධනීයකරණය නොකරන ලද ප්‍රාග්ධන වියදම්, දැනට සිදු කෙරෙන ප්‍රාග්ධන කාර්යයන් ලෙස දක්වා ඇති අතර, වර්ෂය තුල ප්‍රාග්ධනීයකරණය කරන ලද සහ භාවිත කළ ප්‍රාග්ධන වත්කම්, දේපල පිරියත හා උපකරණ වලට මාරු කර ඇත.

3.1.7 කල්බදු පහසුකම්

යම් පහසුකම් සැලසීමක් කල්බදු පහසුකමක් හෝ ඊට කල්බදු පහසුකමක් ඇතුලත් වන්නේද යන්න තීරණය කිරීම, එකී පහසුකමේ අන්තර්ගතය මත පදනම් වන අතර, එම පහසුකම් සැලසීම සපුරාලීම, යම් නිශ්චිත වත්කමක් හෝ වත්කම් භාවිත කිරීම මත සහ එමඟින් වත්කම භාවිත කිරීමට අයිතිය ලබා දෙන්නේද යන්න මත රඳා පවතී.

මූල්‍ය කල්බදු පහසුකම්

වත්කම්හි අයිතියට ආනුශංගික වන, එහෙත් අත්‍යවශ්‍යයෙන් නීතිමය හිමිකම් නොවන සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු අන්දමින් ප්‍රතිපාර්ශවයන් වෙත මාරු කරන ගිවිසුම්, මූල්‍ය කල්බදු පහසුකම් ලෙස වර්ගීකරණය කෙරේ.

සංස්ථාව මූල්‍ය කල්බදු පහසුකම් යටතේ කල්බදු පහසුකම ලබාගන්නා බවට පත්වන විට, කල්බදු පහසුකමට යටත් වත්කම් ප්‍රාග්ධනීයකරණය කර,'දේපල පිරියත හා උපකරණ' තුල ඇතුලත් කරන අතර, කල්බදු පහසුකම් සපයන්නා හට ඇති කෙරෙන වගකීමේ බැඳීම 'කල්බදු ණය හිමිකරුවන්' තුල ඇතුලත් කෙරේ. වත්කමේ සාධාරණ වටිනාකමට හෝ වටිනාකම අඩු මට්ටමක පවතී නම්, අවම කල්බදු ගෙවීම්වල වත්මන් වටිනාකමට මූල්‍ය කල්බදු පහසුකමක් හා ඊට අදාල වගකීම මූලික වශයෙන් හඳුනාගැනේ. වගකීමේ ශේෂය මත ස්ථීර පොලී අනුපාතයක් ලබා දිය හැකි පරිදි කල්බදු පහසුකම තුල සැඟවුණු පොලී අනුපාතය මත පදනම්ව කල්බදු කාලසීමාව තුල 'ශුද්ධ පොලී ආදායම' තුල ගෙවිය යුතු මූල්‍ය ගාස්තු හඳුනාගැනේ.

මෙහෙයුම් කල්බදු

අනෙකුත් සියලුම කල්බදු පහසුකම් මෙහෙයුම් කල්බදු පහසුකම් ලෙස වර්ගීකරණය කෙරේ. සංස්ථාව කල්බදු පහසුකම ලබාදෙන්නා බවට පත්වන විට, කල්බදු දී ඇති වත්කම් ශේෂ පත්‍රය තුල හඳුනා නොගැනේ. කල්බදු කාලසීමාවන් තුල මෙහෙයුම් කල්බදු යටතේ ගෙවිය යුතු හා ලැබිය යුතු කුලී ගාස්තු සෘජු රේඛීය පදනම මත ගිණුම්ගත කෙරෙන අතර, පිළිවෙලින් 'පරිපාලන වියදම්' සහ 'වෙනත් මෙහෙයුම් ආදායම්'හි ඇතුලත් කෙරේ.

3.2.1 තොග/භාණ්ඩ

පළමු ලැබීම් පළමුව නිකුත් කිරීමේ පදනම (First in first out) මත අගයන ලද, යල්පැන ඇති හා සෙමින් ක්‍රියාකරන අයිතමයන් සඳහා දීමනා ලබාදීමෙන් අනතුරුව, පිරිවැයට හා නිෂ්කාශනය කළ හැකි ශුද්ධ වටිනාකමට හෝ මින් කවර හෝ අඩු අගයකට තොග/භාණ්ඩ හඳුනා ගැනේ.

තොග/භාණ්ඩ ගණනය කිරීම

3.2.2 තොග/භාණ්ඩ පිරිවැය

අමුද්‍රව්‍ය

යම් ආනුශංගික වියදමක් ද සහිතව මිලදී ගැනීම්වල පිරිවැය.

දැනට සිදු කරගෙන යන කාර්යයන්

අමුද්‍රව්‍ය පිරිවැය හා විචලනය වන මුළු නිෂ්පාදන වියදම්.

නිම කර ඇති භාණ්ඩ

අමුද්‍රව්‍ය පිරිවැය හා විචලනය වන මුළු නිෂ්පාදන වියදම්.

3.2.3 මුදල් හා මුදල් සමානයන්

මුදල් හා මුදල් සමානයන් තුල අතේ හා බැංකුවේ ඇති මුදල්, ස්ථාවර තැන්පතු ආයෝජන, අතිශයින් ඉහළ ද්‍රවශීලතාවකින් යුතු, මාස හයකින් හෝ ඊට අඩු කාලයකින් නියම ලෙස කල් පිරෙන වෙනත් කෙටි කාලීන ආයෝජන ඇතුලත් වේ. ශේෂ පත්‍රයේ ජංගම වගකීම්හි ණය ගැනීම් තුල බැංකු අයිරා පෙන්නුම් කෙරේ.

3.2.4 පර්යේෂණ පිරිවැය

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබාගැනීමේ අරමුණින් සිදු කරන පර්යේෂණ කටයුතු සඳහා දරන වියදම්, ඒවා හටගැනීමේදී ලාභාලාභ තුල හඳුනාගැනේ.

4. වගකීම් හා ප්‍රතිපාදන

4.1 විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්

4.1.1 අර්ථනිරූපිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාමික පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව, සංස්ථාව පාරිතෝෂික ගෙවීමට බැඳී සිටියි. සංස්ථාව සමඟ අඛණ්ඩ වසර පහක කාලසීමාවක් සම්පූර්ණ කිරීම මත පමණක් යම් සේවකයෙකු හට

පාරිතෝෂික පිළිබඳ වගකීමක් ඇති කෙරේ. මෙම වගකීම සපුරාලීම පිණිස, ශේෂ පත්‍රය තුල යම් ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙන යයි. වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදන හා වර්ෂය අවසානයේ ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදනය අතර වෙනස ආදායම් ප්‍රකාශය තුල හඳුනාගැනේ.

මෙම වගකීම සඳහා බාහිර වශයෙන් අරමුදල් නොසැපයේ. මෙම අයිතමය ශේෂ පත්‍රයේ ජංගම නොවන වගකීම් යටතේ වර්ග කෙරේ.

4.1.2 අර්ථනිරූපිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල

සංස්ථාව මඟින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට දායකත්ව මුදල් සපයනු ලැබේ. අදාල රෙගුලාසිය හා සමගාමීව, අදාල දායකත්ව අරමුදල් මඟින් මෙම දායකත්ව මුදල් ආවරණය කෙරේ. සේවකයින් ආවරණය කරනු ලබන සැලසුම් සඳහා දායකත්වය ලබාදීමේ වගකීම ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගැනේ.

සේවක අර්ථසාධක අරමුදල, වතු සෙවක අර්ථසාධක අරමුදල, ලංකා වැව්ලිකරුවන්ගේ අර්ථසාධක සංගමය

සංස්ථාව හා සේවකයින් විසින් මූලික වැටුප මත හා ඔවුන් තෝරා ගත් ක්‍රමයක් මත සේවක අර්ථසාධක අරමුදල / වතු සේවක අර්ථසාධක අරමුදල / ලංකා වැව්ලිකරුවන්ගේ අර්ථසාධක සංගමය යන ක්‍රම තුනෙන් එකක් සඳහා සංස්ථාව මඟින් 12%ක් ද සේවකයින්ගෙන් 10%ක් ද ලෙස දායක මුදලක් ලබා දෙනු ලැබේ.

සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල

සංස්ථාව විසින් මූලික වැටුප මත සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට 3%ක දායක මුදලක් ලබා දෙයි.

5. ආදායම් ප්‍රකාශය

මෙම ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය වෙනුවෙන්, වියදම් ක්‍රමවේදය මඟින් සාධාරණ ලෙස සංස්ථාවේ කාර්යසාධනයේ අංග නිරූපණය වන හෙයින්, එකී ක්‍රමවේදයේ කාර්යයන් සඳහා අනුගත වේ.

5.1.1 ආදායම් හඳුනාගැනීම

සංස්ථාව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාව සහිත මට්ටම දක්වා ආදායම් හඳුනා ගැනෙන අතර, ගෙවීම සිදු කෙරෙන අවස්ථාව නොසලකා හරිමින් සාධාරණ ලෙස ආදායම් ගණනය කළ හැකිය. ගිවිසුම්ගත ආකාරයෙන් අර්ථනිරූපිත ගෙවීම් නියමයන් සැලකිල්ලට ගනිමින්, ලද හෝ ලැබිය යුතු මුදලේ සාධාරණ වටිනාකමට ආදායම් ගණනය කෙරේ.

ආදායම් හඳුනා ගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත හඳුනා ගැනීමේ පටිපාටිය ද සපුරාලිය යුතුය:

භාණ්ඩ අලෙවි කිරීම

සාමාන්‍යයෙන් භාණ්ඩ බෙදාහැරීම මත භාණ්ඩවල අයිතියේ සුවිශේෂී අවදානම් හා ප්‍රතිලාභ ගැණුම්කරු වෙත විතැන් වන විටදී, භාණ්ඩ අලෙවියෙන් ලද ආදායම් හඳුනාගැනේ.

සේවා සැපයීම

සේවා සපයන ලද හෝ ඉටු කරන ලද ගිණුම්කරණ කාලසීමාවේ සපයනු ලබන සේවාවන්ගෙන් ලද ආදායම් හඳුනාගැනේ.

වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගැනේ. මීට ප්‍රධාන වශයෙන් ආදායම් කළමනාකරණය කිරීම, ලියාපදිංචි ගාස්තු, ගස් සම්බන්ධ ටෙන්ඩර් වලින් ලද ආදායම් හා කල්බදු කුලී ආදායම් අයත් වේ.

5.1.2 වියදම්

ව්‍යාපාරය මෙහෙයවීමේදී හටගන්නා සියලුම වියදම් වර්ෂය සඳහා ලාභයට අයත්වන ආදායම් තුල අන්තර්ගත කෙරේ. අලුත්වැඩියා කිරීම් හා නවීකරණය කිරීම්, එම වියදම් හටගන්නා වර්ෂයේ ලාභාලාභ තුල අන්තර්ගත කෙරේ.

5.1.3 මූල්‍ය වියදම්

යම් වත්කමක් අපේක්ෂිත ලෙස භාවිත කිරීමට හෝ අලෙවි කිරීමට හෝ සූදානම් කරන තෙක් සැලකිය යුතු කාලසීමාවක් අත්‍යවශ්‍යයෙන්ම වැය වන එකී වත්කම අත්පත් කර ගැනීමට, ඉදි කිරීමට හෝ නිෂ්පාදනය කිරීමට සෘජුවම දායක වන ණයට ගැනීමේ පිරිවැය, අදාල වත්කම්හි පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීයකරණය කෙරේ. අනෙකුත් සියලුම ණය ගැනීමේ පිරිවැය එම පිරිවැය හටගන්නා කාලසීමාව තුල වියදම් සේ සැලකේ. සංස්ථාවේ මූල්‍ය වියදම් අයිරාව මත පොලිය, මුදල් මත කොමිස් ගාස්තු, ණය පොලී (බැංකු හා වෙනත්) හා තැරැව්කරුවන්ගේ පොලී යනාදියෙන් සමන්විත වේ.

6. මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම සහ පසුකාලීන ගණනය කිරීම්

6.1 මූල්‍ය වත්කම්

6.1.1 මූලික හඳුනාගැනීම සහ ගණනය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39හි විෂය පථය තුල පවතින මූල්‍ය වත්කම්, යෝග්‍ය පරිදි ලාභ හෝ පාඩු, ණය හා ලැබිය යුතු, කල් පිරීමට තබා ඇති ආයෝජන සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම් මඟින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර, මූලික හඳුනා ගැනීමේදී සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය කිරීම පිළිබඳව නිර්ණය කරයි.

සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකමට හඳුනා ගන්නා අතර, ඊට අතිරේකව ලාභ හෝ පාඩු මඟින් සාධාරණ වටිනාකමට නොවන වත්කම් සම්බන්ධයෙන් සෘජුවම ගණුදෙණු පිරිවැයට අදාලව හඳුනාගැනේ.

සංස්ථාවේ මූල්‍ය වත්කම්වලට මුදල් හා කෙටිකාලීන ස්ථාවර තැන්පතු, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු හා අනෙකුත් තැන්පතු ඇතුලත් වේ. ඉහත මූල්‍ය වත්කම් පහත සඳහන් ජංගම වත්කම් යටතේ පෙන්නුම් කරයි.

6.1.2 පසුකාලීන ගණනය කිරීම්

පසුකාලීනව මූල්‍ය වත්කම් ගණනය කිරීම පහත සඳහන් ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

6.1.2.1 ලාභ හෝ පාඩු මඟින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්

ලාභ හෝ පාඩු මඟින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් තුල අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම් හා ලාභ හෝ පාඩු මඟින් සාධාරණ වටිනාකමට මූලික වශයෙන් හඳුනාගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් ඇතුලත් වේ. මූල්‍ය වත්කම් අලෙවි කිරීමේ හෝ නුදුරු කාලයකදී නැවත මිලදී ගැනීමේ අරමුණින් අත්පත්කරගන්නේ නම්, එකී වත්කම් අලෙවිය සඳහා තබාගන්නා ලද වත්කම් සේ වර්ගීකරණය කෙරේ. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල සංස්ථාව සතුව ලාභ හෝ පාඩු මඟින් සාධාරණ වටිනාකමට ලද කිසිදු මූල්‍ය වත්කමක් නොවීය.

6.1.2.2 ණය හා ලැබිය යුතු

ණය හා ලැබිය යුතු යනු සක්‍රීය වෙළඳපොලක් තුල සඳහන් නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික ගණනය කිරීමෙන් අනතුරුව, පසුකාලීනව එවැනි මූල්‍ය වත්කම්, හායනය කිරීම් අඩු කර ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය (EIR) භාවිත කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ. යම් වට්ටමක් හෝ අත්පත් කරගැනීමක් මත රක්ෂණ වාරිකයක් හා EIRහි වැදගත් අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ගණනය කෙරේ. මෙම EIR ක්‍රමක්ෂය කිරීම මූල්‍ය ප්‍රකාශයේ සඳහන් මූල්‍ය ආදායම් තුල ඇතුලත් කෙරේ. හායනය මඟින් හටගන්නා පාඩු මූල්‍ය ප්‍රකාශයේ සඳහන් මූල්‍ය පිරිවැය තුල හඳුනා ගැනේ.

6.1.2.3 කල් පිරීමට තබා ඇති ආයෝජන

ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් හා ස්ථාවර කල්පිරීම් කල් පිරෙන තෙක් රඳවාගැනීමේ සද්භාවය සහ හැකියාව සංස්ථාව සතු වන විට, එවැනි වත්කම් කල් පිරීමට තබා ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. මූලික ගණනය කිරීමෙන් අනතුරුව, කල් පිරීමට තබා ඇති ආයෝජන, හායනය අඩු කර, ඵලදායී පොලී ක්‍රමවේදය අනුගමනය කරමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. අත්පත්කරගැනීමක් මත යම් වට්ටමක් හෝ රක්ෂණ වාරිකයක් සහ EIRහි වැදගත් අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. EIR ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශයේ සඳහන් මූල්‍ය ආදායම් තුල ඇතුලත් කෙරේ. හායනයෙන් ජනනය වන පාඩු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය ලෙස හඳුනා ගැනේ. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල සංස්ථාව සතුව කල් පිරීමට තබා ඇති කිසිදු ආයෝජනයක් නොමැත.

.

6.1.2.4 විකිණීමට ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන යන්නට ස්කන්ධ හා ණය ඇපකර යනාදිය ඇතුලත් වේ. ස්කන්ධ ආයෝජන විකිණීමට ඇති සේ වර්ගීකරණය කරනුයේ, අලෙවිය සඳහා ඇති හෝ ලාභ හෝ පාඩු මඟින් සාධාරණ වටිනාකම සඳහා යනුවෙන් වර්ගීකරණය කර නොමැති හෙයිනි. මෙම කාණ්ඩයේ ණය ඇපකර යනු අවිනිශ්චිත කාලසීමාවක් සඳහා තබා ගැනීමට අපේක්ෂා කරන, ද්‍රවශීලතා අවශ්‍යතාවලට සහ වෙළඳපොල තත්ත්වයන්හි වෙනස්කම්වලට ප්‍රතිචාරී ලෙස අලෙවි කළ හැකි ඇපකර වේ.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල සංස්ථාව සතුව විකිණීමට ඇති කිසිදු මූල්‍ය ආයෝජනයක් නොමැත.

6.1.2.5 හඳුනා ගැනීමෙන් බැහැර කිරීම

යම් මූල්‍ය වත්කමක් (හෝ අදාල වන පරිදි, මූල්‍ය වත්කමක කොටසක් හෝ ඒ හා සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනාගැනීමෙන් තොරව බැහැර කරනුයේ,

i). එම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය කල් ඉකුත් වූ විට;
ii). සංස්ථාව මඟින් එම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ සිය අයිතිය පවරාදුන් විට හා 'pass-through' ක්‍රමය යටතේ යම් තෙවන පාර්ශවයක් වෙත කිසිදු ආකාරයක ප්‍රමාදයකින් තොරව ලද මුදල් ප්‍රවාහ ගෙවීමට යම් වගකීමක් භාර ගත් විට; සහ එමෙන්ම
(අ) සංස්ථාව විසින් සැලකිය යුතු ලෙස වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා දී ඇති විට; හෝ
(ආ) සංස්ථාව විසින් වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස පවරා දී හෝ රඳවා ගෙන නොමැති නමුත්, වත්කමේ පාලනය පවරා දී ඇති විට.

6.1.2.6 මූල්‍ය වත්කම් හායනය වීම

යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හායනය වී ඇති බවට යම් වාස්තවික සාක්ෂියක් පවතීද යන්න සංස්ථාව විසින් සෑම වාර්තා කිරීමේ දිනයකදීම අගයනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදුව ඇති යම් සිද්ධියක් හෝ සිද්ධි කිහිපයක ප්‍රතිඵලයක් ලෙස හායනය සිදු ව ඇති බවට

වාස්තවික සාක්ෂි ඇත්නම් හා සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ හැකි එම මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත එම පාඩු සිදු කරන ලද සිදුවීම මඟින් බලපෑමක් සිදු කර ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් පමණක් එකී මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් කාණ්ඩය හායනය වී ඇතැයි සැලකිය යුතුය.

යම් ණයගැතියන් හෝ ණයගැතියන් කාණ්ඩයකට සුවිශේෂී මූල්‍ය දුෂ්කරතාවකට මුහුණ දෙමින් සිටින බව, පොලී හෝ ප්‍රධාන ගෙවීම් වංචා කිරීම හෝ පැහැර හැරීම, ඔවුන් බුන්වත්භාවයට පත්වන බව හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානය කිරීමකට සූදානම් වන බව සහ වංචාවන් සමඟ සහසම්බන්ධ වන ගෙවුම් හිඟ හෝ ආර්ථික තත්ත්වයන්හි වෙනස්කම් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ තුල ගණනය කළ හැකි අඩුවීමක් ඇති බවට නිරීක්ෂණය කළ හැකි දත්ත මගින් පෙන්නුම් කරන විටෙක හායනය වීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ හැකිය. දැනට සංස්ථාව විසින් ලැබිය යුතු වෙළඳ සඳහා නිශ්චිත ප්‍රතිපාදනයක් හඳුනාගෙන ඇත.

6.1.2.7 ක්‍රමක්ෂය පිරිවැයට ගෙන යන ලද මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට ගෙන යන ලද මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, සංස්ථාව විසින් පළමුව තනි තනි වශයෙන් වැදගත් හෝ එසේ තනි තනි වශයෙන් සුවිශේෂී නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සාමූහික වශයෙන් හායනය වීමක් ඇති බවට වාස්තවික සාක්ෂි පවතින්නේද යන්න අගයනු ලබයි. සුවිශේෂී වන හෝ නොවන යම් තනි තනි වශයෙන් අගයන මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් හායනය වීමක් පිළිබඳ කිසිදු වාස්තවික සාක්ෂියක් නොමැති බවට සංස්ථාව නිර්ණය කරන්නේ නම්, ඊට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කාණ්ඩයක් තුල එම වත්කම ඇතුලත් කර, හායනය වීම සම්බන්ධයෙන් සාමූහික ලෙස ඇගයේ. හායනය වීම සම්බන්ධයෙන් තනි තනි වශයෙන් අගයන ලද සහ හායනය වීමක් හඳුනාගත් හෝ එසේ අඛණ්ඩව සිදු වන බව හඳුනාගත් වත්කම් සාමූහික හායන ඇගයුමක් තුල ඇතුලත් නොකෙරේ.

යම් හායන පාඩුවක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම්, වත්කමේ ඉදිරියට ගෙන යන ශේෂය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල (දැනට සිදුව නොමැති අනාගතයේ අපේක්ෂා කරන ණය පාඩු හැර) වෙනස ලෙස එම පාඩුවේ ප්‍රමාණය ගණනය කෙරේ. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම සඳහා එම මූල්‍ය වත්කමේ මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් ලබා දෙයි.

6.2 මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීම හා ගණනය කිරීම

ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වගකීම් හෝ ණය හා ණයගැනීම් හෝ යෝග්‍ය පරිදි ඵලදායී සීමාවක් තුල සීමාසහිත මූල්‍ය උපකරණ ලෙස හඳුනාගෙන ඇති ව්‍යුත්පන්න ලෙස ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39හි විෂයපථය තුල පවතින මූල්‍ය වගකීම් වර්ගීකරණය කෙරේ. සංස්ථාව විසින් මූලික හඳුනාගැනීම්වලදී සිය වගකීම් වර්ගීකරණය පිළිබඳව තීරණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන් සාධාරණ වටිනාකමට හඳුනාගනු ලැබුවද, ණය හා ණයගැනීම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය පිරිවැය ඔස්සේ ඉදිරියට ගෙන යනු ලබයි. මීට සෘජුවම අදාල වන ගණුදෙණු පිරිවැය ඇතුලත් වේ. සංස්ථාවේ මූල්‍ය වගකීම් තුල වෙළඳ හා වෙනත් ගෙවිය යුතු සහ බැංකු අයිරා ඇතුලත් වේ.

පසුකාලීන ගණනය කිරීම්

මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ.

හඳුනාගැනීමෙන් බැහැර කිරීම

යම් වගකීමක් යටතේ පවතින මූල්‍ය වගකීමක් ඉටු කළ විට හෝ අවලංගු වූ විට හෝ කල් ඉකුත් වූ විට එම වගකීම හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

7. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් පළමු වරට අදාල කර ගැනීම (SLFRS/LKAS)

2012 ජනවාරි මස 01 දිනට බලාත්මක වන පරිදි ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රමිතිකරණ ප්‍රමිතීන් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පළමු වරට සංස්ථාව විසින් 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලදී. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය ඇතුලු සහ ඒ දක්වා කාලසීමාවන් සඳහා සංස්ථාව විසින් මුල් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව සිය මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සටහන්

දේපළ පිරියක සහ උපකරණ
ශ්‍රී ලංකා රුපියල් වලින්.

ප්‍රධාන කාර්යාලය	සින්නක්කර ඉඩම්	ගොඩනැගිලි	උපකරණ	ගෘහභාණ්ඩ	මෝටර් වාහන	පරිගණක	එකතුව
තක්සේරු වියදම්							
2018 ජනවාරි 1 දිනට	**4,031,845**	**4,959,427**	**10,935,726**	**2,456,911**	**66,115,401**	**3,054,875**	**91,554,185**
එකතු කිරීම්	-	-	800,240	2,508,875	-	887,835	4,196,950
අපහරණයන්	-	-	-	-	-	-	-
2018 දෙසැම්බර් 31 දිනට	**4,031,845**	**4,959,427**	**11,735,966**	**4,965,787**	**66,115,401**	**3,942,710**	**95,751,135**
ක්ෂයවීම්							
2018 ජනවාරි 1 දිනට	**-**	**4,959,384**	**9,853,234**	**1,981,802**	**66,094,153**	**2,674,122**	**85,562,695**
වර්ෂය සඳහා ක්ෂය ගැලපීම්	-	-	215,320	303,966	-	298,948	818,234
අපහරණයන්	-	-	-	-	-	-	-
2018 දෙසැම්බර් 31	**-**	**4,959,384**	**10,068,554**	**2,285,768**	**66,094,153**	**2,973,070**	**86,380,929**
ශුද්ධ පොත් අගය							
2018 දෙසැම්බර් 31 වනවිට	**4,031,845**	**43**	**1,667,412**	**2,680,018**	**21,247**	**969,640**	**9,370,206**

වතුයාය	ඉඩම්	ගොඩනැගිලි	උපකරණ හා ගෘහ භාණ්ඩ සවිකිරීම්	මෝටර් වාහන	වෙනත් හිමිකම්	යන්ත්‍රෝපකරණ	එකතුව
තක්සේරුකරණ වියදම							
2018 ජනවාරි 1	**645,345,972**	**162,771,551**	**24,134,486**	**79,919,892**	**6,672,973**	**115,713,335**	**1,034,558,209**
එකතු කිරීම්	-	7,277,474	301,732	832,800	-	1,304,057	9,716,063
2018 දෙසැම්බර් 31 දිනට	**645,345,972**	**170,049,025**	**24,436,218**	**80,752,692**	**6,672,973**	**117,017,392**	**1,044,274,272**
ක්ෂයවීම් හා අපහායනයන්							
2018 ජනවාරි 1	**-**	**100,892,582**	**18,060,179**	**67,361,193**	**6,672,972**	**96,875,570**	**289,862,495**
වර්ෂයට ක්ෂයවීම් සඳහා ගාස්තුව	-	3,941,872	587,722	2,347,967	-	757,502	7,635,063
2018 දෙසැම්බර් 31 දිනට	**-**	**104,834,455**	**18,647,901**	**69,709,160**	**6,672,972**	**97,633,072**	**297,438,210**
ශුද්ධ පොත් අගය							
2018 දෙසැම්බර් 31 දිනට	**645,345,972**	**65,214,570**	**5,788,317**	**11,043,532**	**1**	**19,384,321**	**746,836,061**
2018 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලය සහ වතුයායන්හි ශුද්ධ (ප්‍රධාන කාර්යාලය සහ වතුයායන්හි	**649,377,816**	**65,214,613**	**7,455,729**	**13,723,551**	**21,248**	**20,353,961**	**756,206,267**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සටහන්

ජීව විද්‍යාත්මක වත්කම්
ශ්‍රී ලංකා රුපියල් වලින්.

පරිභෝජනීය ජීව විද්‍යාත්මක වත්කම්	**31.12.2018** දිනට	**31.12.2017** දිනට
දැව	3,314,581,133	3,312,160,200

නකල්ස් සංරක්ෂණ කලාපයට සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ එන මෙම දැව සහිත ප්‍රදේශ දැව සහිත ප්‍රදේශ වලින් සමහර සීමා නිර්ණය කිරීම අවසන් කර නොමැති බැවින් 2018 වර්ෂය තුළ කිසිදු තක්සේරුවක් සිදු කර නොමැත. එසේම මෙම තක්සේරුව මහින් විශාල වශයෙන් මුදල් පිටතට ගලායාමක් සිදුවනු ඇති අතර පවතින දැඩි මුදල් ප්‍රවාහ තත්ත්වය හේතුවෙන් මෙම අවස්ථාවේ දී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හට මෙම පිරිවැය දැරීමේ හැකියාවක් නොමැත.

ධාරක ජීව විද්‍යාත්මක වත්කම්

සමුච්චිත ක්ෂයවීම් අඩු කර පිරිවැයට ධාරක ජීව විද්‍යාත්මක වත්කම් ගෙන යනු ලැබේ.

	තේ	පොල්	ගම්මිරිස්	රබර්	කෝපි	වෙනත්	ප්‍රතිරෝපණය	එකතුව
පිරිවැය හෝ තක්සේරුව								
2018 ජනවාරි 31 දිනට	**464,757,498**	**3,588,367**	**2,867,652**	**15,270,484**	**1,501,242**	**3,893,376**	**23,191,779**	**514,970,398**
එකතු කිරීම්	6,095,322	220,840	370,566	-	-	591,779	1,313,649	**8,592,156**
පෙර වර්ෂය හා ගැළපුම්								-
මාරුවීම්								-
අපහරණ								-
2018 දෙසැම්බර් 31 දිනට	**470,852,820**	**3,809,207**	**3,238,219**	**15,270,484**	**1,501,242**	**4,485,155**	**24,505,428**	**523,662,555**
								-
ක්ෂයවීම්	**357,072,493**	**2,646,007**	**1,921,548**	**2,744,531**	**1,406,674**	**610,916**	**1,654,287**	**368,056,457**
2018 ජනවාරි 31 දිනට								-
වසරට ක්ෂයවීම් ගාස්තුව	1,984,601	22,931	112,569	374,806	5,114	136,273	698,603	3,333,614
පෙර වර්ෂය හා ගැළපුම්	-	-	-	-	-	1,283	-	1,283
අපහරණ	-	-	-	-	-	-	-	-
2018 දෙසැම්බර් 31 දිනට	**359,057,094**	**2,668,938**	**2,034,117**	**3,119,337**	**1,411,788**	**745,906**	**2,352,890**	**371,390,070**
ශුද්ධ පොත් අගය								
2018 දෙසැම්බර් 31 දිනට	**111,795,726**	**1,140,269**	**1,204,102**	**12,151,147**	**89,454**	**3,739,249**	**22,152,538**	**152,272,484**
මුළු ජීව විද්‍යාත්මක වත්කම් (සටහන් 9.1 + 9.2)	**111,795,726**	**1,140,269**	**1,204,102**	**12,151,147**	**89,454**	**3,739,249**	**22,152,538**	**3,466,853,617**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සටහන්

ශ්‍රී ලංකා රුපියල් වලින්.

ආයෝජනය දේපළ	31.12.2018 දිනට	31.12.2017 දිනට
රජයේ ඉඩම් ප්‍රදාන	1,600,601,926	1,600,601,926
ප්‍රාග්ධන අගය වැඩිකිරීම සඳහා ඉඩම්	10,918,715	10,918,715
	1,611,520,641	**1,611,520,641**

1982 පෙබරවාරි 27 දිනැති අංක 181/12 ගැසට් පත්‍රයට අනුව සමහර වතුවල අයිතිය ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා දෙන ලදී. මේවා 1992 වර්ෂයේ දී දීර්ඝ කාලීන බදු පදනම මත ප්‍රාදේශීය වැවිලි සමාගම් (RPCs) දහනවයක් (19) වෙත භාර දෙන ලදී. කළමනාකාරිත්වයේ අදහස වන්නේ, මෙම ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත භාර දුන් දිනය වන විට එම ඉඩම්වල පිරිවැය සාධාරණ ලෙස ඉඩම් පිරිවැය පිළිබිඹු කරන අතර එම මුදල් ප්‍රමාණයන් පොත්වල ඉදිරියට ගෙන යන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40 ට අනුව, ආයෝජන දේපළක් මුලින්ම (සංචරක අවස්ථාවේ දී) පිරිවැයටත් ඉන්පසුව සාධාරණ අගය මාදිලියට හෝ පිරිවැය මාදාලායට මිණිය යුතු බවත්ය. එනමුත් පවරන දිනට වන විට මූල්‍ය අගයක් ලබා ගැනීමට කළමනාකාරිත්වයට නොහැකි වූ අතර ඒ වෙනුවට වතුවල සාධාරණ අගය ලෙස සලකනු ලැබුවේ ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට භාර දෙන අවස්ථාවේ දී තිබූ අගයයි. එබැවින් 1992වන විට ඉඩම් වටිනාකම ප්‍රාදේශීය වැවිලි සමාගම්වල ශේෂ පත්‍රවලින් සමානුපාතිකව ලබා ගන්නා ලදී.

තක්සේරු කිරීම සඳහා විශාල මුදලක් වැය වන බැවින් ආයේජන දේපළ අගය කිරීම නොකරන ලද අතර මෙදිනට විශාල ප්‍රමාණයක ව්‍යවස්ථාපිත ගෙවීම් පියවා නොමැති පසුබිමක් තුළ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි වත්මන් මුදල් ප්‍රවාහ තත්ත්වය මෙවැනි විශාල වියදමක් දැරීමට ඉඩ නොදෙන

බඩු තොග	31.12.2018 දිනට	31.12.2017 දිනට
නිමි නිෂ්පාදන	38,764,682	14,018,305
පරිභෝජ්‍ය තොග	9,476,474	11,164,149
	48,241,155	**25,182,454**

අඩු පිරිවැය සහ ශුද්ධ ප්‍රත්‍යාගණන අගය (Net Revaluation Value -NRV) සලකා බැලීමෙන් පසුව බඩු තොග වටිනාකම ගණනය කෙරිණි.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සටහන්

ශ්‍රී ලංකා රුපියල් වලින්.

වෙළඳ සහ වෙනත් අයවීම්	**31.12.2018** දිනට	**31.12.2017** දිනට
වෙළඳ ණය ගැතියන් - ප්‍රධාන කාර්යාලය(අ)	49,756,366	50,580,280
අඩුවීම් : ප්‍රධාන කාර්යාලයේ නිශ්චිත අපහායනයන්	(15,404,568)	(15,404,568)
වෙළඳ ණය ගැතියන් - සියලු වතුයායන් (ආ)	64,303,903	59,426,206
අඩුවීම් : වතුයායන්හි ණය ගැතියන්ගේ නිශ්චිත අපහායනයන්	(49,128,420)	(49,128,420)
වෙනත් අයවීම් - ප්‍රධාන කාර්යාලය	21,822,783	17,901,856
වෙනත් අයවීම් - වෙනත් වතුයායන්	44,201,179	43,017,308
	115,551,243	**106,392,662**
(අ)වෙළඳ ණය ගැතියන් - ප්‍රධාන කාර්යාලයට පහත දෑ ඇතුළත් වේ.		
බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් (BCC)	15,404,568	15,404,568
අඩුවීම් : ප්‍රධාන කාර්යාලයේ විශේෂ අපහායනයන්	(15,404,568)	(15,404,568)
අමු දළු ගැණුම්කරුවන්ගෙන් ලැබී යුතු අයවීම්	25,899,588	27,721,676
ඇල්කඩුව වතුයාය	1,916,092	1,916,092
වුඩ්සයිඩ් වතුයාය	992,125	992,125
ඩක්වරි	2,500,000	2,500,000
සුළු සහ වෙනත් ණයකරුවන්	3,043,992	1,673,292
	34,351,797	**34,803,185**
(ආ)වෙළඳ ණය ගැතියන් - වතුයායන්ට පහත දෑ ඇතුළත් වේ.		
අනියම් ණය ගැතියන්	7,754,648	6,350,718
පාරිභෝගික ණය ගැතියන්	41,071,407	41,071,407
සුළු ආදායම් ණය ගැතියන්	2,588,530	2,588,530
ජනතා වතු සංවර්ධන මණ්ඩලය	1,668,269	1,668,269
නිෂ්පාදිත ණය ගැතියන්	752,520	752,520
අඩුවීම් : වතු ණය ගැතියන්ගේ නිශ්චිත අපහායනයන්	(47,537,070)	(47,537,070)
අඩුවීම් : බොල් ණය සඳහා ප්‍රතිපාදන	(1,591,349)	(1,591,349)
අන්තර් වැවිලි ජංගම ගිණුම්	1,930,180	1,930,180
වෙනත් ණය ගැතියන්	8,538,349	5,064,582
	15,175,484	**10,297,786**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සටහන්

ශ්‍රී ලංකා රුපියල් වලින්.

වෙනත් තැන්පතු	**31.12.2018** දිනට	**31.12.2017** දිනට
තැන්පතු හා අත්තිකාරම්	-	2,087,520
	-	**2,087,520**

මුදල් හා කොටස් අයිතිය	**31.12.2018** දිනට	**31.12.2017** දිනට
වාසි සහගත ශේෂ :		
බැංකුවේ සහ අතැති මුදල්		
ප්‍රධාන කාර්යාලය	52,932,601	89,444,649
වතුයායන්	879,699	10,202,389
	53,812,300	**99,647,037**

දායක ප්‍රාග්ධනය	**31.12.2018** දිනට	**31.12.2017** දිනට
රාජ්‍ය දායකත්වය	3,041,262,947	3,279,250,925
රජයෙන් ඉඩම් ප්‍රදාන	2,616,589,903	2,220,601,926
	5,657,852,850	**5,499,852,851**

රජයේ සම්පූර්ණ දායකත්වයට රජයෙන් (භාණ්ඩාගාරයෙන්) ලැබුණු මුදල් සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට ගැසට් නිවේදන හරහා රජය විසින් පවරා ඇති ඉඩම් ඇතුළත් වේ. සමාලෝචිත වර්ෂය තුළ දීර්ඝ කාලයක් ගෙවීමට ඇති ව්‍යවස්ථාපිත ගෙවීම් නිරාකරණය කිරීම සඳහා රුපියල් මිලියන 90 ක් ලැබුණු අතර රුපියල් මිලියන 68ක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මෙහෙයුම් වියදම් සඳහා ලැබුණි.

සේවක ප්‍රතිලාභ වගකීම්	**31.12.2018** දිනට	**31.12.2017** දිනට
ආරම්භක ශේෂය - වතුයායන්	337,135,449	331,230,311
ආරම්භක ශේෂය - ප්‍රධාන කාර්යාලය	15,067,921	14,813,144
පාරිතෝෂික ගැලපුම්		
වර්ෂය සඳහා ප්‍රතිපාදන	25,853,232	27,819,035
ඌන ප්‍රතිපාදන / අධි ප්‍රතිපාදන ගැලපුම් (වතුයාය හා ප්‍රධාන කාර්යාල)	(10,612,275)	8,340,889
ගෙවිය යුතු පාරිතෝෂික වෙත මාරු කළ	(17,658,276)	(23,880,447)
වර්ෂය තුළ ගෙවීම්	(9,024,774)	(2,894,191)
වෙනත් ගණුදෙනු	(1,163,150)	(3,225,371)
	339,598,126	**352,203,370**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සටහන්

ශ්‍රී ලංකා රුපියල් වලින්.

වෙළඳ සහ අනෙකුත් ගෙවීම්	**31.12.2018** දිනට	**31.12.2017** දිනට
ප්‍රධාන කාර්යාලය**(අ)**	277,029,870	263,406,193
වතුයාය**(ආ)**	812,109,113	861,658,660
මෙහෙයුම් නොවන ශේෂය	1,933,044	1,933,044
	1,091,072,027	**1,126,997,896**

(අ)ප්‍රධාන කාර්යාල සඳහා වෙළඳ සහ අනෙකුත් ගෙවීම්වලට පහත දැ ඇතුළත් වේ

	31.12.2018 දිනට	**31.12.2017** දිනට
අත්තිකාරම් - ඔපල්ගල (කල්බදු අත්තිකාරම්)	4,480,000	4,480,000
දැව අත්තිකාරම්	786,379	786,379
පොලි කෙමික්ස්	715,389	715,388
පර්ත් වතුයාය	6,932,399	6,985,532
ජනතා වතු සංවර්ධන මණ්ඩලය	97,709,342	97,709,342
තැරැව්කරුවන් -ලංකා කොමොඩිටි බ්‍රෝකර්ස් ලිමිටඩ් සහ සිලෝන් ටී බෝර්ඩ්	8,968,682	9,454,115
අත්තිකාරම් ලැබීම් - අමු දළු මිලදී ගැනුම්කරුවන්	15,369,689	3,582,524
රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	28,709,029	28,709,029
පොහොර සංස්ථාව	35,931,679	35,931,679
හලාවත වැවිලි සමාගම	33,210,959	31,610,959
ණය - ලංකා බණිජ වැලි	25,000,000	25,000,000
උපචිත වියදම්	2,903,924	1,128,743
සේවක අර්ථසාධක අරමුදල - ගෙවිය යුතු	235,607	175,019
වතු සේවක අර්ථසාධක අරමුදල - ගෙවිය යුතු	442,729	224,109
වැවිලිකරුවන්ගේ අර්ථසාධක අරමුදල - ගෙවිය යුතු	421,371	
සේවක භාරකාර අරමුදල	123,447	98,155
ගෙවිය යුතු පාරිතෝෂික	290,420	580,580
ආරක්ෂිත තැන්පතුව- අමු තේ දළු	-	2,000,000
වෙනත් ගෙවිය යුතු මුදල්	11,997,826	13,925,917
ගස් අලෙවිය මත ණය	2,801,000	-
එකතුව	**277,029,870**	**263,406,193**

(ආ)වතු සඳහා වෙළඳ සහ අනෙකුත් ගෙවීම්වලට පහත දැ ඇතුළත් වේ

	31.12.2018 දිනට	**31.12.2017** දිනට
සුළු ණය දෙන්නන්	48,154,401	41,108,917
ඇල්කඩුව වතුයාය	172,137	172,137
වතු ජංගම ගිණුම	-	15,571,454
ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතු	6,379,570	6,379,570
වෙනත් වගකීම්	19,646,826	17,455,661
වෘත්තීය සමිති	7,585,493	7,122,674
කාර්ය මණ්ඩලයට සහ කම්කරුවන්ට ගෙවිය යුතු මුදල් විගණන ගාස්තු සඳහා	30,758,462	40,253,653
ප්‍රතිපාදන	4,789,355	4,377,300
සේවක අර්ථසාධක අරමුදල. ගෙවිය යුතු	367,667,260	406,651,176
වතු සේවක අර්ථසාධක අරමුදල ගෙවිය යුතු	2,817,215	990,214
වැවිලිකරුවන්ගේ අර්ථසාධක අරමුදල. ගෙවිය යුතු	104,263	179,118
සේවක භාරකාර අරමුදල. ගෙවිය යුතු	8,189,921	17,600,977
ගෙවිය යුතු පාරිතෝෂික	245,328,735	230,175,454
උපචිත වියදම්	3,718,286	1,962,286
ගෙවිය යුතු පැමිණීම් පැමිණීම් ප්‍රසාද දීමනා	1,762,706	1,849,762
ගෙවිය යුතු අධිභාර සේවක - අර්ථසාධක අරමුදල ගෙවීම්	49,970,387	48,002,479
ගෙවිය යුතු අධිභාර - සේවක භාරකාර අරමුදල	292,830	2,193,935
ගෙවිය යුතු අධිභාර - පාරිතෝෂික	7,832,287	14,841,411
වෙනත් ගෙවීම්	6,938,979	4,770,480
එකතුව	**812,109,113**	**861,658,660**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සටහන්

ශ්‍රී ලංකා රුපියල් වලින්.

ආදායම	**31.12.2018** දිනට	**31.12.2017** දිනට
තේ	211,586,544	210,310,097
අමු තේ දළු	376,969,092	432,232,396
සුළු බෝග	1,238,100	6,835,779
රබර්	8,156,688	13,150,501
මුළු ආදායම	**597,950,423**	**662,528,772**

තේ අලෙවියට කසළ තේ විකිණීමෙන් ලැබෙන ආදායම ඇතුළත් වේ. අදාළ වියදම්/ විකුණුම් පිරිවැය අඩු කිරීමෙන් පසුව කසළ තේ, සුළු බෝග සහ ගස් විකිණුම් වලින් ලත් ආදායම පෙන්වා ඇත.

වෙනත් ආදායම්	**31.12.2018** දිනට	**31.12.2017** දිනට
ගස් ටෙන්ඩරය	55,095,950	45,396,115
කල් බදු කුලිය	30,448,900	25,289,441
කළමනාකරණ ගාස්තුව	16,189,644	15,688,237
පොලී ආදායම	3,197,413	4,134,857
හුන්නස්ගිරි දියඇල්ලේ විවේක උද්‍යානයෙන් ලැබෙන ආදායම	3,451,097	3,577,444
වෙනත් ආදායම් - ප්‍රධාන කාර්යාලය සහ වතුයායන්	6,535,510	7,913,463
සංචාරක බංගලා ආදායම	590,328	628,800
වෙනත් මුළු වියදම්	**115,508,842**	**102,628,358**

පරිපාලන වියදම්	**31.12.2018** දිනට	**31.12.2017** දිනට
පුද්ගලික වියදම්	41,954,687	35,393,501
නිශ්චිත දායක මුදල් - සේ.අ.අ., වැ.අ.අ. සහ ව.අ.අ.	3,149,081	2,501,948
නිශ්චිත දායක මුදල් - සේ.හා.අ.	788,778	590,875
ක්ෂයවීම් -ප්‍රධාන කාර්යාලය	818,234	879,479
පාරිතෝෂික වියදම් - ප්‍රධාන කාර්යාලය සහ වතුයායන්	25,853,232	27,835,515
විකිණුම් වියදම්	3,518,478	2,868,920
වෙනත් පරිපාලන වියදම් - ප්‍රධාන කාර්යාලය සහ වතුයායන්	52,583,757	42,667,097
මුළු පරිපාලන වියදම්	**128,666,247**	**112,737,334**

මූල්‍යමය වියදම්	**31.12.2018** දිනට	**31.12.2017** දිනට
මුදල් මත කොමිස්	4,694,004	4,480,462
තේ තැරැව්කරුවන්ගේ අත්තිකාරම් මත පොලී	4,620,075	1,547,928
බැංකු ගාස්තු	50,177	40,076
බැංකු අයිරා පොලී සහ මූල්‍ය කොමිස්	1,126,160	205,530
වෙනත් ණය පොලී - හලාවත වැවිලි සමාගම	1,600,000	1,600,000
මුළු මූල්‍යමය වියදම්	**12,090,415**	**7,873,996**

ආදායම් බදු

පසුගිය වර්ෂ දහ අට පුරාම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව තුළ ආදායම් බදු ගණනය දක්නට නොලැබේ. මෙම හේතුව නිසා සහ අඛණ්ඩ පාඩු ලැබීම් හේතුවෙන් බදු අය කළ හැකි ලාභයන් ලැබීමට ඉඩ නොමැති බව උපකල්පනය කරන අතර ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් ආදායම් බදු ගෙවීමට ඇති ඉඩකඩ ඉතා අඩුය. පසුගිය වර්ෂ විසි දෙක පුරාම (1995 සිට 2016) දක්වා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ලාභ ලබා ඇත්තේ වසර හතරක් පමණි.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

ආශ්‍රිත පාර්ශව අනාවරණ

රජය සහ රජය මගින් පාලිත ආයතන සමඟ ගණුදෙණු

සාමාන්‍ය මෙහෙයුම් වලදී, සංස්ථාව අදාළ පාර්ශවයන් සමග ගනුදෙනු සිදු කරයි. අදාළ පාර්ශවයන් අතර ශ්‍රී ලංකා රජය (සංස්ථාවේ අවසාන හිමිකරු ලෙස රජය), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය පාලිත ආයතන ඇතුළත් වේ. ගණුදෙණු වල විස්තර සහ සංස්ථාව රජය සහ රාජ්‍ය පාලිත ආයතන සමග තනි තනිව වැදගත් වන සහ වෙනත් ගණුදෙණු වලදී තනි තනිව නොව සාමූහිකව වැදගත්වන එකඟතාවන් පහත පරිදි වේ:

ශ්‍රී ලංකා රුපියල් වලින්.

	2018	2017
හිඟ ශේෂය:		
ගෙවිය යුතු		
රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	28,709,029	28,709,029
පොහොර සංස්ථාව	35,931,679	35,931,679
මහජන බැංකුව	-	-
හලාවත වැවිලි සමාගම	31,610,959	31,610,959
ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම	25,000,000	25,000,000
ඇල්කඩුව වතුයාය	172,137	172,137
ජනතා වතු සංවර්ධන මණ්ඩලය	97,709,342	97,709,342
පර්ත් වතුයාය	6,985,532	6,932,399
ලැබිය යුතු		
ඇල්කඩුව වතුයාය	1,916,092	1,916,092
ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)	41,071,407	41,071,407
ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)	1,668,269	1,668,269

බැඳීම් සහ අවිනිශ්චිතතා

මේ වන විට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කළමනාකාරීත්වයට එරෙහිව නඩු 516 ක් ගොනු කර ඇති අතර එයට නොගෙවූ සේ.හා.අ. , සේ.අ.අ. සහ පාරිතෝෂික හිමිකම් ඉල්ලා සිටින නඩු ද ඇතුළත් වේ. නීතිඥවරුන් උපදෙස් දී ඇති ආකාරයට සංස්ථාව සඳහා මේ සම්බන්ධව ගත හැකි ක්‍රියාමාර්ගයන් සාර්ථක වීමට සම්භාවිතාවක් නොව හැකියාවක් පවතින බවට උපදස් දී ඇත. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ආපතිකතා බැරකමක් සඳහා ප්‍රතිපාදනයක් සලසා නැත. කෙසේ වෙතත් 2018 වසරේදීත්, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව භාණ්ඩාගාරයෙන් ලැබුණු අරමුදල් වෙතින් ව්‍යවස්ථාපිත බැරකම්වල කොටසක් ගෙවී ය.

ශේෂ පත්‍ර දිනයට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයට පසු සිදුවූ සියලුම ප්‍රමාණාත්මක බලපෑමක් සිදුකරන සිදුවීම් සලකා බලන ලද අතර නිසි ගැලපුම් සහ අනාවරණයන් අවශ්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශයට එක් කරන ලදී.

පූර්ව වර්ෂ ගැලපුම්

පූර්ව වසර ගැලපුම්වලට පෙර මූල්‍ය වසරට අදාළ පහත ගනුදෙනු ඇතුළත් වන අතර මෙම වසරේදී එම ගැලපුම් සිදු කරන ලදී.

විස්තර	2018	2017
හිඟ වැටුප්	641,567	17,368,956
සෙ.අ.අ/සෙ.හා.අ. අධිභාර	439,572	51,078,837
පාරිතෝෂික (අධිභාර, ඌන/අධි ප්‍රතිපාදන)	-	(348,903)
වෙනත් වියදම්/ගැලපුම්	-	-
එකතුව	**1,081,138**	**68,098,890**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පිදල්/ඒ/එස්එල්එස්සී/01/2018/06 මගෙ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2021 මැයි 19 දින

සභාපති

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ හි 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. අභිතකර මතය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ හි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණනය කරන ලදි. සංස්ථාවේ වර්ෂික වාර්තාව සමග ප්‍රසිද්ධ කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සහ 2019 ඔක්තෝබර් 11 දින සංස්ථාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලද ගනුදෙනු පිළිබඳ වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම් කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අභිතකර මතය සඳහා පදනම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

(අ) ප්‍රමිත අංක 07 හි 31 ඡේද ප්‍රකාරව පොලී ලැබීම්වලින් වන මුදල් ප්‍රවාහයන් වෙනම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ හෙළිකළ යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ මුදලින් ලැබුණු රු.2,853,628 ක පොලී ආදායම වෙනම හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ප්‍රමිත අංක 07 හි 44 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මුදල් නොවන ගනුදෙනු ඇතුළත් නොකළ යුතු වුවත් විලම්බිත වත්කම් සහ කෙරිගෙන යන වැඩවල සිදුවූ එකතුව රු.683,214 ක අඩු වීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ප්‍රමිත අංක 13 හි 37 ඡේදය ප්‍රකාරව වර්ෂ 10 කට අධික කාලපරිච්ඡේදයක සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.මි.649 ක් ලෙස පැවත එන සින්නක්කර ඉඩම් සහ සංස්ථාවේ වතු 14 කට අයත් හෙක්ටයාර් 10,917 ක ඉඩම් සාධාරණ අගයට නක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ප්‍රමිත අංක 16 හි 37 ඡේදය ප්‍රකාරව එක සමාන ස්වභාවයක් හා භාවිතයක් පවතින වත්කම් පමණක් කාණ්ඩ කර ගිණුම්ගත කළ යුතු බව දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සංස්ථාවට අයත් වතුයායන්හි පවතින පරිගණක, උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් යන ස්ථාවර වත්කම් වර්ග සියල්ලම උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් යන තනි අයිතමය යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඉ) ප්‍රමිත අංක 16 හි 73 (ඇ) ඡේදය ප්‍රකාරව භාවිතා කළ ක්ෂය අනුපාතිකය හෝ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් මූල්‍ය ප්‍රකාශනයන් මඟින් හෙළිදරව් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ඉඩම් සංවර්ධන පිරිවැය ක්ෂය කිරීමේ දී භාවිතා කරන ලද ක්ෂය අනුපාතය හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) ප්‍රමිත අංක 40 හි 75 (අ) ඡේදය ප්‍රකාරව ආයෝජිත දේපළ මිණුම් කිරීමට භාවිතා කරන ආකෘතිය මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතු වුවත්, සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව හෙළිදරව් කර ඇති ආයෝජිත දේපළ පිරිවැය හෝ සාධාරණ වටිනාකම් යන ආකෘති දෙකෙන් කුමන ආකෘතිය භාවිතා කර තිබේද යන්න අනාවරණය කර නොතිබුණු අතර, 1992 වර්ෂයේ ප්‍රාදේශීය වතු සමාගම් ශේෂ පත්‍රවල රු.මිලියන

1,611.5 ක් ලෙස දක්වා තිබූ අගයම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආයෝජන දේපළ යටතේ දක්වා තිබුණි

(උ) ප්‍රමිත අංක 40 හි 78 (අ) ඡේදය ප්‍රකාරව ආයෝජන දේපළවල විස්තරයක් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතු වුවත්, 1982 පෙබරවාරි 27 දිනැති අංක 181/12 දරන රජයේ ගැසට් පත්‍රය මඟින් සංස්ථාවට ලබා දී ඇති දේපළ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.

(ඌ) ප්‍රමිත අංක 41 හි 4 වන ඡේදය ප්‍රකාරව වන වගාව, පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතු වුවත්, පිරිවැය රු.24,505,428 ක් වූ වන වගාව ධාරක ජීව විද්‍යාත්මක වත්කම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(එ) ප්‍රමිත අංක 41 හි 43, 44, හා 45 ඡේද ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් පරිණත හා පරිණත නොවූ වගාවන් ලෙස වෙන වෙනම පෙන්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඡංගම නොවන වත්කම් යටතේ අනාවරණය කර තිබූ රු. 152,272,484 ක ජීව විද්‍යාත්මක වත්කම් එසේ වර්ගීකරණය කර ඉදිරිපත් කර නොතිබුණි.

(ඒ) ප්‍රමිත අංක 41 හි 54 (ඉ) ඡේදය ප්‍රකාරව ධාරක ජීව විද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් ප්‍රයෝජනවත් ආයු කාලය හෝ භාවිතා කළ ක්ෂය වීමේ ප්‍රතිශතය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු වුවත්, සංස්ථාව සතුව ඇති වතුයායන් 17 ක හෙක්ටයාර් 4114 ක තේ වගාව ක්ෂය කිරීම සඳහා භාවිතා කරන ලද ක්ෂය අනුපාතය මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් සටහන් 3.1.4.2 දරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව සාධාරණ අගයකට පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් අගය කරන බව දක්වා තිබුණද, 2012 වර්ෂයේදී පැවති රු.3,312,160,200 ක ජීව විද්‍යාත්මක වත්කම් හා 2018 වර්ෂයේදී ප්‍රාග්ධනීත කරන ලද රු. 2,420,933 ක ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ අගයකට නක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. තවද, මෙසේ සාධාරණ අගයකට නක්සේරු කර ගිණුම් ගත කරනු වෙනුවට සංස්ථාව සතු වතු 11 ක හෙක්ටයාර් 726.73 ක් පුරා විහිදුනු වන වගාවන් සමාලෝචිත වර්ෂය අවසානයට සියයට 4 කින් එනම් රු.698,603 කින් ක්‍රමක්ෂය කර ගිණුම්ගත කිරීම නිසා සංස්ථාවේ අලාභයද එම වටිනාකමින් අඩි ගණනය වී තිබුණි.

1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇති ස්ථාවර වත්කම් වර්ග හතක් සඳහා සමාලෝචිත වර්ෂයේ නිවැරදි ක්ෂය ප්‍රමාණය රු. 6,716,561 ක් විය යුතු වුවද, සංස්ථාවේ ලෙජර ගිණුම් හා නිවැරදිව ගණනය කරන ලද ක්ෂය ප්‍රමාණය අතර රු.428,654 ක වැඩිවීමක් පැවතීම නිසා එම ප්‍රමාණයෙන් අලාභය අඩි ගණනය වී තිබුණි.

(ආ) වුඩ්සයිඩ් හා නිකොලොය වතුයායන්වල පිළිවෙලින් රු.10,814,200 ක් හා රු.14,074,561 ක ගෙවිය යුතු පාරිතෝෂික අගයන්,ගෙවිය යුතු පාරිතෝෂික ලෙස හඳුනා නොගැනීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් රු.24,888,761 කින් ඌන ගණනය වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ රු.1,609,054 ක මදුරු කුරු තොගයක් සහ රු.23,381,823 ක් වූ කැලෑ බොක්ක, මිඩ්ලන්ඩ් හා රංගල යන වතු යායන්වල නිමි තේ කිලෝ ග්‍රෑම් 44,639 ක්, වතු යායන් 15 ක පොහොර, රසායනික ද්‍රව්‍ය තොගයක් භෞතිකව සත්‍යාපනය නොකර පොත් අගය පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම නිසා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලයෙහි නිවැරදිභාවය පිළිබඳව සැහීමට පත්විය නොහැකිව තිබුණි.

(ඈ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ ණයගැනි ශේෂයට රු.6,644,470 ක පැළ නවාන් වටිනාකමක් ඇතුළත් කර තිබුණි. එම පැළ නවාන් වටිනාකමින් වතු යායන් හයක රු.4,978,340 ක් ලෙස අගය කර තිබූ පැළ නවාන් භෞතිකව නොමැති වීම හෝ යල් පැනීම නිසා ඒවායේ වටිනාකම් ශූන්‍ය අගයක් ගෙන තිබුණි.

(ඉ) කම්කරු විනිශ්චයාධිකාර නඩුවකදී 2016 වර්ෂයේ සංස්ථාව ගෙවා තිබූ රු.1,910,225 ක වන්දි මුදල 2016 වර්ෂයේ ජංගම වත්කම් යටතේ නැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. නවද, 2017 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එම මුදල වියදමක් ලෙස දක්වා ජංගම වගකීමක් ලෙස අනාවරණය කර තිබුණි. ඉහත සදොස් ගිණුම්කරණ සටහන් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේද එම ශේෂය ජංගම වත්කම් හා ජංගම වගකීම් යටතේ කිසිදු වෙනසක් නොවී එලෙසම පැවතුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ වාහන අලුත්වැඩියා කිරීම සඳහා දරන ලද රු.602,039 ක අයහාර වියදම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් වල වෙළඳ ලැබිය යුතු දෑ ලෙස ඇතුළත් කිරීම හේතුවෙන්, එම වටිනාකමින් ජංගම වත්කම් අධිගණනය වී තිබුණු අතර, අලාභයද එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කොටසක් ලෙස ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය පහත ගිණුම්කරණ අඩුපාඩු සහිතව පිළියෙල කර තිබුණි.

(i) රු.1,600,000 ක උපචිත පොලී වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අලාභයට සිදුකරන ගැලපීම් යටතේ එකතු කළ යුතු වුවත්, එම වටිනාකම එකතු කිරීමක් ලෙස දක්වා එම ප්‍රමාණයම නැවත අඩු කර දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් තුලින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහය අඩු වී තිබුණි.

(ii) පෙර කාලපරිච්ඡේදයන්ගේ අලාභයට කළ ගැලපීම් ලෙස සමාලෝචිත වර්ෂයේ හඳුනාගත් රු.1,081,138 ක වටිනාකම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගැලපීම් කිරීමේ දී රු.1,240,487 ක් ලෙස රු.159,349 කින් අඩුවෙන් ගලපා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.235,500 ක පරිගණක මෘදුකාංග සඳහා මුදල් ගෙවා තිබුණේ පසු වර්ෂයේ වුවත්, සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරම් යටතේ දක්වා තිබුණි.

1.2.4 නොසැසඳුණු පාලන ගිණුම්

අන්තර් වතු පාලන ගිණුම්වල හර සහ බැර ශේෂයන් අතර රු. 1,930,180 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඡායම නොවන වත්කම් යටතේ දක්වා ඇති, ධාරක ජීව විද්‍යාත්මක වත්කම් සහ දේපළ පිරියත උපකරණ යන වත්කම්වල, ස්ථාවර වත්කම් ලේඛන සහ අදාළ වත්කම් වල ලෙජර් ගිණුම් අතර, පිළිවෙලින් රු.360,271,689 ක හා රු.174,726,841 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වෙනත් අතුරු භෝග සඳහා එකතු කර ඇති වටිනාකම් රු.591,779 ක් වුවද, වතු ගිණුම් අනුව එම ශේෂය රු.273,637 ක් වුයෙන් මෙම ශේෂ අතර රු.318,142 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ සංස්ථාවේ මුළු ණයකිම් ශේෂය රු.1,089,138,983 ක් වූ අතර, එම ශේෂයෙන් රු.543,711,753 ක් හෙවත් සියයට 50 ක් වර්ෂ 4 සිට 14 දක්වා,

කාල පරාසයට අයත් වන අතර, මෙම දිගුකාලීන ණය ශේෂ නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2010 හා 2011 වර්ෂවලට අදාළව ඕපල්ගල වතුයායේ එකතුව රු.786,379 ක ගස් ටෙන්ඩර් නැන්පතු අත්තිකාරම්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා ඇති රු.88,813,279 ක ණයගැනි ශේෂය තුල වර්ෂ 04 ත් 14 ත් අතර කාල පරාසයක සිට පැවත එන රු.70,092,898 ක ණය ශේෂ ද, වර්ෂ 15 ඉක්මවා ඇති බිසිසි සමාගමෙන් අයවිය යුතු රු.15,404,568 ක ණය ශේෂයක් ද පැවතුණි. මෙම ණයගැනි ශේෂ අයකර ගැනීම සඳහා සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේ දී ද ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) 2014 ඔක්තෝබර් 15 දින සංස්ථාව විසින් ගිවිසුමකට එළඹීමකින් තොරව රු.මිලියන 6 ක ණය මුදලක් ඇල්කඩුව වැවිලි සමාගමට ලබා දී තිබුණු අතර, 2015 වර්ෂයේ සිට මෙම ණය මුදල ගෙවීම් පැහැර හැරීම නිසා අය නොවී පවතින ණය ශේෂය රු.1,916,092 ක් විය.

1.2.7 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 1,140,025,407 ක් වූ දේපළ පිරියත හා උපකරණ යටතේ පවතින රු.649,377,817 ක් වූ ඉඩම් වල හා රු. 175,008,452 ක් වූ ගොඩනැගිලි වල අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඔප්පු/බලපත්‍රද, රු.146,868,093 ක් වූ වාහන වල අයිතිය තහවුරු කර ගැනීම සඳහා ලියාපදිංචි සහතිකද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු.3,314,581,133 ක පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සහ රු.160,864,640 ක ධාරක ජීව විද්‍යාත්මක වත්කම් ශේෂයන් සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය ලේඛන සහ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයටත් පෙර සිට පැවත එන රු.1,933,043 ක අක්‍රීය ශේෂයක් සමාලෝචිත වර්ෂයේදී ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් තුළ අනෙකුත් ගෙවිය යුතු දෑ ලෙස දක්වා තිබුණු අතර, මෙම ශේෂය සනාථ කර ගැනීම සඳහා ලේඛන ගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ හා වතු යායන්වල පිළිවෙලින් රු.103,131,935 ක් හා රු.15,187,725 ක් වශයෙන් එකතුව රු.118,319,660 ක් වූ ණයගිමි ශේෂ සහ එකතුව රු.53,881,380 ක ණය ගැනි ශේෂ 09 ක් සඳහා ශේෂ සනාථ සහ පසුකාලීන ශේෂ නිරවුල් කිරීම් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2006 වසරේ සිට වතුයායන් 12 කට අයත් රු.6,379,570 ක ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ලෙස ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ සමාලෝචිත වර්ෂයේදී ද පෙන්වා තිබුණු අතර, මෙම ශේෂ සනාථ කර ගැනීම සඳහා ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එකතු කළ අගය මත බදු වශයෙන් රු. 3,486,444 ක මුදලක් ගෙවිය යුතුව තිබුණු අතර, එකතු කළ අගය බද්දෙන් නිදහස් බවට සංස්ථාව දරන මතය සනාථ කර ගැනීම සඳහා ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(උ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ අනාවරණය කර ඇති රු.50,220,922 ක ණයගැති ශේෂ සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය ලේඛනගත සාක්ෂි සංස්ථාව සතුව නොතිබුණි.

(ඌ) 2012 වර්ෂයටත් පෙර සිට පැවත එන සමාලෝචිත වර්ෂයේද මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ණයගැති ශේෂයෙන් අඩු කර පෙන්වා ඇති රු. 47,537,070 ක විශේෂ හානිකරණය සඳහා වෙන් කිරීම් සහ රු. 1,591,349 ක අඩමාණ ණය වෙන්කිරීම් සඳහා භාවිතා කල පදනම් පැහැදිලි කර නොතිබීම නිසා එහි නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(එ) පසුගිය වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.73,683,136 ක් වටිනා ගොඩනැගිලි , වාහන සහ යන්ත්‍රසූත්‍ර වැනි ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර තිබුණු අතර මේ සඳහා හේතු වූ කරුණු එහි සඳහන් කර නොතිබුණි.

(ඒ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති රු.1,645,340 ක වන කළමණාකරනය වියදම් නහවුරු කිරීම සඳහා අවශ්‍ය ලේඛනගත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම්, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම්, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය හා 12 වන වගන්තිය පරිදි පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

2.1.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ අභිනතකර මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද 2.2.1 (අ) i, ii, iii, iv, 2.2.1 (ඇ) ,2.2.1 (ඇ) ,2.2.2 (අ) සහ 2.2.2 (ඇ) යන නිර්දේශයන් හැර , අනෙකුත් නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වන වගන්තිය හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ ii කොටසේ 16(i) වගන්තිය	2006 වර්ෂයේ සිට රු.367,667,260 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් වගකීමද, රු.8,189,921 ක සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් වගකීමද, සමාලෝචිත වර්ෂය අවසන් දින දක්වා ගෙවීමට කටයුතු කර නොනිබුණු අතර, මේ නිසා සංස්ථාවට එකතුව රු.50,263,217 ක අධිභාර පනවා තිබුණි.
(ආ)	2003 ජුනි 02 දිනැති අංක 12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය	මූල්‍ය වර්ෂයක් අවසාන වී දින 60 ක් ඇතුළත අස්ථිත්වයට අදාළ වාර්ෂික ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2020 ජුනි 29 දින වන අතර, ඒ වන විට ගිණුම් ඉදිරිපත් කළ යුතු කාලය වර්ෂ 1 ½ කින් ඉක්ම ගොස් තිබුණි.
(ඇ)	2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය	සංස්ථාව සතු තේ කර්මාන්තශාලා 07 ක් වර්ෂ 5 සිට වර්ෂ 40 කට අධික කාලයක සිට භාවිතයට ගෙන නොනිබුණු අතර, මෙම වසා දමා ඇති කර්මාන්තශාලාවන්හි පවතින ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර, මෙවලම් හා උපකරණ එම වසා දමා ඇති කාලපරිච්ඡේදය තුළම භාවිතයෙන් ඉවත් කර ඇතත් එම වත්කම් අපහරණය කිරීමට හෝ සංස්ථාවට වඩා ලාභදායී ආයෝජන ක්‍රියාවකට යෙදවීමට කටයුතු කර නොනිබුණි.
(ඈ)	2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 2 (අ) ඡේදය සහ අංක 02/2015 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය	සංස්ථාව සතු භාවිතයෙන් ඉවත් කළ ලොරි රථ 13 ක්, ට්‍රැක්ටර් හා ට්‍රෙලර් 25 ක්, කාර් රථ 07 ක්, ජීප් රථ 03 ක් , ගිලන් රථ 04 ක් , ස්ප්‍රිවිල් රථ 01 ක් හා මෝටර් බයිසිකල් 43 ක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොනිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

2.2.4.1 ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (අ) ප්‍රකාරව සංස්ථාව විසින් 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) රු. 1,398,000 ක වියදමක් දරා වතුයායන් සඳහා පැතලි මල නොකන වානේ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.3.11.(අ) ප්‍රකාරව ලංසුකරුගෙන් ලංසු සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 පරිදි ප්‍රතිග්‍රහණ ලිපියක් සැපයුම්කරු වෙත නිකුත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රු. 840,000 ක වියදමින් මදුරු කුරු ඇසුරුම් කවර 200,000 ක් මිලදී ගෙන තිබුණු අතර, ලංසු ලබා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 6.3.1(අ) ප්‍රකාරව ටෙන්ඩර් පෙට්ටියක් තුළට හෝ ලියාපදිංචි තැපැලෙන් ලබා නොගෙන ඊ-මේල් මඟින් ලබා ගෙන තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 7.4.1 පරිදි කටයුතු නොකර ලංසු විවෘත කිරීම සහ ඇගයීම කටයුතු දින 100 කින් ප්‍රමාද කර තිබුණි.

(ඈ) රු .1,950,000 ක වියදමින් ප්‍රධාන කාර්යාලයෙහි බිම් මහළ හා පළමු මහළෙහි කොටස් බෙදා වෙන් කර තිබුණු අතර, ප්‍රසම්පාන මාර්ගෝපදේශ 6.2.2 පරිදි ලංසු ලබා දීමේ අවම කාල සීමාව ලංසුකරුවන්ට ලබා දී නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.8.1 (ආ) පරිදි තාක්ෂණික ඇගයීම් කමිටුවට විෂය පිළිබඳ විශේෂඥයෙකු සහභාගි වී නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශය 8.9.1 පරිදි කොන්ත්‍රාත්කරු වෙත විධිමත් ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 (අ) ප්‍රකාරව ලිඛිත ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.12.2 පරිදි වැඩ අවසන් කිරීමේ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ලිපියක් (Completion Report) ලබා නොගෙන කොන්ත්‍රාත්කරුට රු.250,000 ක අවසන් ගෙවීමද කර තිබුණි.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් ආයතනය ගත් ක්‍රියා මාර්ග

1.2.1ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 7හි ඡේද අංක 31 ප්‍රකාරව පොලී ආදායම මඟින් ජනනය වන මුදල් ප්‍රවාහය වෙනම දැක්විය යුතුය යන ප්‍රකාශයට එකඟ වන අතර පොලී ආදායමෙන් ජනනය වන මුදල් ප්‍රවාහය දක්වා තිබුණද එය වෙනම හෙලිදරව් කිරීමක් (වෙනම පෙන්නුම් කිරීමක්) සිදුකර නොමැත. මුදල් ප්‍රවාහ පිලියෙල කිරීමේ දී සිදුවන මෙම හෙලිදරව් කිරීමේ වරද නිවැරදි ලෙස හෙලිදරව් කිරීමට කටයුතු සුදානම් කර ඇත.

(ආ) මෙය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය (මුදල්මය නොවන) නොවන ගනුදෙනු ද්විත්වයක් බවත් මෙයද පෙර වර්ෂ ගනනාවක් තිස්සේ වරදවා දැක්වීමක් වන අතර එය නිවැරදි කිරීමේදී ඇති වූ ශේෂ වෙනසකි. මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිලියෙල කිරීමේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07ප්‍රකාරව මින් ඉදිරියට මෙය නිවැරදි කරගැනීමට පියවර ගෙන තිබේ.

(ඇ) (ඈ)

මෙම ස්ථාවර වත්කම් - ඉඩම් යටතේ දක්වා ඇති රු. 649,377,816.36 වටිනාකම පහත අයුරින් විස්තරාත්මකව දැකිවිය හැකිය.

වතුයාය	විස්තරය	ගිණුම් වලට එක් කල වර්ෂය	වටිනාකම
වලහන්දුව රාජ්‍ය වතුයාය	ඉඩම් වටිනාකම	2012	620,000,000.00
අලකොල්ල රාජ්‍ය වතුයාය	ඉඩම් සංවර්ධන පිරිවැය	1996	1,782,168.12
කොට ගග රාජ්‍ය වතුයාය	ඉඩම් සංවර්ධන පිරිවැය	1996	1,439,934.95
ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය	ඉඩම් සංවර්ධන පිරිවැය	1996	1,247,732.90
ගෝමර රාජ්‍ය වතුයාය	ඉඩම් සංවර්ධන පිරිවැය	1996	2,562,873.16
භාගල රාජ්‍ය වතුයාය	ඉඩම් සංවර්ධන පිරිවැය	1996	2,291,138.59
හෙයාපාර්ක් රාජ්‍ය වතුයාය	ඉඩම් සංවර්ධන පිරිවැය	1996	1,436,449.45
හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය	ඉඩම් සංවර්ධන පිරිවැය	1996	903,048.77
කැලෑබොක්ක රාජ්‍ය වතුයාය	ඉඩම් සංවර්ධන පිරිවැය	1996	6,621,281.82
මිඩ්ලන්ඩ්ස් රාජ්‍ය වතුයාය	ඉඩම් සංවර්ධන පිරිවැය	1996	3,062,644.36
ඕපල්ගල්ල රාජ්‍ය වතුයාය	ඉඩම් සංවර්ධන පිරිවැය	1996	1,772,601.24
රංගල රාජ්‍ය වතුයාය	ඉඩම් සංවර්ධන පිරිවැය	1996	2,226,098.34
ප්‍රධාන කාර්යාලය	ඉඩම් වටිනාකම	1996	4,031,845
මුළු වටිනාකම			**649,377,816.36**

මෙම ස්ථාවර වත්කම් - ඉඩම් සඳහා ඉහතින් සඳහන් කර ඇති විස්තරයට ඇතුලත් තොරතුර හැර වෙනත් කිසිදු තොරතුරක් හෝ ලේඛනයක් නොමැති අතර ස්ථාවර වත්කම් - ඉඩම් ඇතුලත් නිවැරදි ස්ථාවර වත්කම් ලේඛනයක් 1996 වර්ෂයේ පටන් මේ දක්වා පවත්වා ගෙන ගොස් නොමැත.

මෙම ස්ථාවර වත්කම් ලේඛනය පිලියෙල කිරීම සඳහා විශාල පිරිවැයක් වැය වන අතර වසර ගනනාවක් තිස්සේ සංස්ථාව මුහුණපාන මූල්‍යමය දුෂ්කරතාවය හේතුවෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් මේ දක්වා

සංස්ථාව සතු නොවේ. ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීමේදී මෙම ස්ථාවර වත්කම් හඳුනාගැනීම, අගය කිරීම සහ ලේඛනය පිලියෙල කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර වශයෙන් සෑම වතුයායකම ස්ථාවර වත්කම් හඳුනාගැනීම සහ වත්කම් ලැයිස්තුවක් පිළියෙල කිරීම මේ වන විට සාර්ථකට නිමා කර ඇති අතර ඉදිරි වැඩ කටයුතු සඳහා එනම් ස්ථාවර වත්කම් අගය කිරීම සහ අවසන් ලේඛනය පිලියෙල කිරීම සඳහා අවශ්‍ය විශේෂඥ සේවය ඒ සඳහා විශේෂඥ වූ පුද්ගලයකුගෙන් හෝ ආයතනයකින් ලබා ගත යුතු වේ. මේ සඳහා අවශ්‍ය අරමුදල් ඉල්ලා අමාත්‍යාංශයට හා මහ භාණ්ඩාගාරයෙන් ලිපි යවා ඇති අතර ඒ සම්බන්ධයෙන් යම් සාධාරණ අවධානයක් යොමු කරන ලෙසද කාරුණිකව දන්වා සිටිමි.

(ඉ) මෙය සමාලෝචික වර්ෂයේ එනම් 2018 මුල්‍ය වර්ෂයේදී මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අත්හැරීම් දෝෂයක් නිසා වෙන් 2018 අවසන් ගිණුම් තුල ඇතුලත් නොවන අතර මෙම අත්හැරීම් දෝෂය 2019 මුල්‍ය වර්ෂයේදී අවසන් ගිණුම් වල සිට නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සුදානම් කර ඇත.

(ඊ) (උ) මෙම ආයෝජිත දේපල 2012 ගිණුම්වලට මෙම රු. 1,611,520,641.00 යන අගය ගෙන ඇති අතර මෙහි පවතින ගැටලු හා එකඟ වන බව දන්වා සිටී. මෙම ප්‍රාදේශීය වතුයායන්හි සෘජු පාලනය මහ භාණ්ඩාගාරයෙන් සිදු කරන අතර වාර්ෂිකව සිදුවන වෙනස්වීම් වාර්තා කිරීම සහ හෙලිදරව් කිරීම (ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව) අවශ්‍ය තොරතුරුමය සම්බන්ධතාවයක් 1992න් පසුව සංස්ථාව සහ ප්‍රාදේශීය වතුයායන් අතර ඇතිකරගෙන නොමැත. මෙම කාරණා සියල්ල ඉතා ඉක්මණින් නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය පියවරයන් සිදු කරමින් පවතී.

(ඌ) සංස්ථාවේ ජීව විද්‍යාත්මක වත්කම් තුල පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම්- දැව යන්නෙන් පෙන්නුම් කරන්නේ විකුණුම් කටයුතු කිරීම වෙනුවෙන් සුදානම් ආයතනය සතු දැව සම්පත වන අතර ඒ ඒ වර්ෂයේදී වන සම්පත වෙනුවෙන් වටිනාකම් එක් වන පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ලෙස සැලකිය නොහැකි ජීව විද්‍යාත්මක වත්කම් - වන සම්පත් තුලින් නිරූපනය කරයි. මෙම පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ලෙස සැලකිය නොහැකි ජීව වත්කම්-වන සම්පත්, ජීව විද්‍යාත්මක වත්කම් ලෙස සැලකිය හැකි ජීව විද්‍යාත්මක වත්කම් - වන සම්පත් බවට පත්වූ පසු එම වටිනාකම් අගය කිරීමක් සිදුකර පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් - දැව යන්න වෙත මාරුකිරීමක් සිදු කල යුතු වේ.

ස්ථාවර වත්කම් ලේඛනය මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් ලේඛනය පිලියෙල කිරීම ද මේ වන විට ක්‍රියාත්මක වී ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව වාර්තා කිරීමටද මෙම කාරණා නිවැරදි කර ගනිමින් ඉදිරි 2021 මූල්‍ය වර්ෂයන්හිදී මේවා නිවැරදි කිරීමට අවශ්‍ය බව දන්වමින් අමාත්‍යාංශයට හා මහ භාණ්ඩාගාරයෙන් මූල්‍ය ප්‍රතිපාදන මේ වන විට සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතාවයන් නිසා මෙම වියදම් දැරීමට සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතාවයන් නිසා මෙම වියදම් දැරීමට සංස්ථාව මේ මොහොතේ සමත් නොවේ. මේ සම්බන්ධව යම් සාධාරණ අවධානයක් යොමු කරන ලෙස ද කාරුණිකව දන්වා සිටිමි.

(එ) ස්ථාවර වත්කම් ලේඛනය මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් ලේඛනය පිලියෙල කිරීම ද මේ වන විට ක්‍රියාත්මක වී ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව වාර්තා කිරීමටද මෙම කාරණා නිවැරදි කර ගනිමින් ඉදිරි 2021 මූල්‍ය වර්ෂයන්හිදී මේවා නිවැරදි කිරීමට අවශ්‍ය බව දන්වමින් අමාත්‍යාංශයට හා මහ භාණ්ඩාගාරයෙන් මූල්‍ය ප්‍රතිපාදන මේ වන විට සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතාවයන් නිසා මෙම වියදම් දැරීමට සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතාවයන් නිසා මෙම වියදම් දැරීමට සංස්ථාව මේ මොහොතේ සමත් නොවේ. මේ සම්බන්ධව යම් සාධාරණ අවධානයක් යොමු කරන ලෙසද කාරුණිකව දන්වා සිටිමි.

(ඒ) මෙය සමාලෝචික වර්ෂයේ එනම් 2018 මුල්‍ය වර්ෂයේදී මුල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී අත්හැරීම් දෝෂයක් නිසා වෙන් 2018 අවසන් ගිණුම් තුල ඇතුලත් නොවන අතර මෙම අත්හැරීම් දෝෂය 2019 මුල්‍ය වර්ෂයේදී අවසන් ගිණුම් වල සිට නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සුදානම් කර ඇත.

1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ඔබ විසින් දක්වා ඇති වෙනසට හේතුව වන්නේ වර්ෂය තුල එක් කල වාණිජ දැව වටිනාකම ප්‍රාග්ධනිත කිරීමයි. පෙර වර්ෂ ගණනාවක් තිස්සේ මෙම අගයන් වන වගා වියදම් යනුවෙන් යනුවෙන් ප්‍රාග්ධනිත කර

ක්ෂය කරන ලද අතර ඔබ විසින් පෙර එවා ඇති විගණන විමසුම් අනුව මෙම ප්‍රාග්ධන එක් කිරීම සිදු කරන ලදි. එය ඔබ විසින් පහත (ඈ) හි පැහැදිලිව සඳහන් කර තිබේ.

1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ස්ථාවර වත්කම් ලේඛනය මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් ලේඛනය පිලියෙල කිරීම ද මේ වන විට ක්‍රියාත්මක වී ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව වාර්තා කිරීමටද මෙම කාරණා නිවැරදි කර ගනිමින් ඉදිරි 2021 මූල්‍ය වර්ෂයන්හිදී මේවා නිවැරදි කිරීමට අවශ්‍ය බව දන්වමින් අමාත්‍යාංශයට හා මහ භාණ්ඩාගාරයෙන් මූල්‍ය ප්‍රතිපාදන මේ වන විට සංස්ථාවේ මූල්ය දුෂ්කරතාවයන් නිසා මෙම වියදම් දැරීමට සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතාවයන් නිසා මෙම වියදම් දැරීමට සංස්ථාව මේ මොහොතේ සමත් නොවේ. මේ සම්බන්ධව යම් සාධාරණ අවධානයක් යොමු කරන ලෙසද කාරුණිකව දන්වා සිටිමි.

(ආ) වුඩ්සයිඩ් සහ නිකොලොය වතුයායන්හි පිළිවෙලින් රු.10,814,200.00 සහ රු. 14,074,561.00 ක ගෙවිය යුතු ශේෂයන් ඔවුන් විසින් ගනු ලැබූ අගයන් 2018 මූල්‍ය වර්ෂයට පමණක් කිසිසේත්ම අදාළ වන්නක් විය නොහැකිය. මන්දයත් 2018 මූල්‍ය වර්ෂය සඳහා වතුයායන් සියල්ලගේම පාරිතෝෂික වියදම (වෙන් කිරීම) වන්නේ රු.25,853,232.00 කි. එබැවින් මෙම වතුයායන් 2 පමණක් පාරිතෝෂික වෙන් කිරීමක් හෝ පාරිතෝෂික ගෙවිය යුතු ගිණුමට බැර කිරීමක් සිදුවන 2018 මූල්‍ය වර්ෂයේ ලාභයට හෝ අලාභයට බලපෑමක් සිදුවන බව සඳහන් කළ ඉහත සඳහන් වටිනාකම් නිසා රු. 24,888,761.00 කින් වාර්ෂික ලාභය ඌණ ගණනය වී තිබුණු බවට ඔබ විසින් කරන ලද ප්‍රකාශයට එකඟ විය නොහැක.

(ඇ) අවසන් තොගය තුළ ඇතුළත් රු. 1,609,504.00 වටිනා මදුරු කූරු තොගය මේ වන විට පවතින්නේ ගල්පිහිල්ල රාක්ෂාව තේ කර්මාන්තශාලාව ඉදිරිපිට වූ ශාලාවක ය. සංස්ථාව විසින් වතු ප්‍රජාවගේ ජන ජීවිතය නගා සිටුවීමටත් පොදු ජනයා හට ස්වයං රැකියා අවස්ථාවක් ලබා දීමේ අරමුණින් මෙම මදුරු කුරු ව්‍යාපෘතිය පටන් ගෙන ක්‍රියාත්මක කරගෙන ගිය අතර මෙය වෙළෙඳපොළ වෙත යොමු කරගෙන විකුණා ගැනීමට නොහැකි වූ තොගය මෙලෙස අදටත් ගබඩාවේ පවතී. මේ වන විට යම් අගයකට එනම් වැය වූ පිරිවැය ආවරණය වන අයුරින් හඳුන්කූරු වෙළෙන්දන් හට මිල ගණන් කැඳවා මෙම තොග විකිණීමට මේ වනවිට පියවර ගෙන ඇත. මෙය 2018 මූල්‍ය වර්ෂයේ අලාභයක් වශයෙන් පෙන්නුම් කර සංස්ථාවේ අලාභයට එක් කිරීමට පියවර නොගනු ලැබුවේ ඉහතින් සඳහන් කරන ලද හේතුව මතය. මෙය විකිණූ පසු එහි ලාභය හෝ අලාභය ගණනය කර එය අදාල ගිණුම් කාලච්ඡේදයේ විස්තිරණ ආදායම් ප්‍රකාශයට ගැනීමට කටයුතු කිරීමට තීරණය කර ගෙන ඇත.

(ඈ) ඔබ විසින් දක්වා ඇති තේ පැළ තවාන් රු. 6,644,470.00 මුළු වටිනාකම දක්වා ඇති ලේඛනයේ රු.4,978,340.00ක වටිනාකමක් සහිත භෞතිකව නොපවතින තොග ලෙස දක්වා ඇති ශේෂය ගැන කෙටි විස්තරයක් පහතින් දැක්වේ.

මේවා යම් කාලසීමාවක දී නව පැළ සිටුවීම (New planting), අතර පැළ සිටුවීම (Infilling) වැනි තේ වගා ප්‍රමාණය වැඩි කිරීමේ පරමාර්ථයෙන් ඒ ඒ වතුයායන් වල සිදුකරන ලද පැළ තවාන් වන අතර යම් යම් හේතූන් නිසා (උදා: කාලගුණික, දේශගුණික ගැටලු) මේවා ක්ෂේත්‍රයේ සිටුවා ගැනීමට නොහැකි තත්ත්වයට පත් වී ඇත. ඇත්ත වශයෙන්ම මේවා භෞතිකව නොමැති බව සඳහන් කළ නොහැක. මන්දයත් බොහොමයක් තේ පැළ තවාන් ක්ෂේත්‍රයේ සිටුවා ගැනීමට නොහැකි තත්ත්වයට මුහුකුරා ගිය පැළ තවාන් වශයෙන් (වැඩුණු තේ ගස්) එක් එක් වතුයායන් වල පවතින බැවිනි. මෙහිදී සඳහන් කළ යුතු තවත් වැදගත් කරුණක් වන්නේ සමහර වතුයායන් වල වතු අධිකාරිවරුන් මෙම පැළ තවාන් වලින් යම්කිසි පැළ ප්‍රමාණයක් හෝ ප්‍රයෝජනයට ගත හැකි දැයි බලා උපරිම ප්‍රයෝජනයක් ගත් අවස්ථා ද වේ.
මෙහිදී සිදුවී ඇති අනෙක් කරුණ දෙස බැලීමේදී 2018 වර්ෂයේ අවසන් ගිණුම් තුළට මෙම සම්පූර්ණ පැළ තවාන් ගැනීමේදී එනම් රු. 6,644,470.00 ක මුදල යම් වරදකින් තොගය වශයෙන් මූල්‍ය තත්ත්ව විස්තරයේ සඳහන් කළ යුතුව තිබුණ ද එය ලැබිය යුතු ණයගැති ගිණුමේ සටහන්ව ඇත. මෙය ශේෂ පත්‍රයෙන් මහ

හැරීමක් සිදු වී නොමැත. මෙම අයිතමය වරදවා දැක්වීමක් වශයෙන් හඳුනාගෙන ඇති අතර මෙය ඉදිරි මූල්‍ය වර්ෂයේදී එනම් 2019 මූල්‍ය වර්ෂයේ දී නිවැරදි කර ගැනීමට කටයුතු සූදානම් කර ඇත.

(ඉ) මෙම නඩු තීන්දුවට අදාලව යම් වෙන් කිරීමක් කිරීමට වේ යැයි සාධාරණ තහවුරුවක් ඇතිවී තිබූ බැවින් එය මුදල් වලින් උසාවිය ගෙවීමක් සිදු කෙරිණි.(නීති අංශයේ උපදෙස් මත) එහිදී බැංකු ගිණුම හර කොට රු. 1,910,225.00 සහ මෙම මුදල දැනටමත් උසාවි භාරයේ පමණක් පවතින බැවින් එය මූල්‍ය තත්ත්ව විස්තරයේ ජංගම වත්කම් යටතේ දැක්වීය. ඉන් අනතුරුව ඔබ විසින් ලබා දුන් පරිදි එය අසම්භාව්‍ය වගකීමක් වශයෙන් හා වියදමක් වශයෙන් හඳුනා ගැනීමට අවශ්‍ය නිසා එය පූර්ව වර්ෂයේ ලාභයට ගැලපීමක් ලෙස එය හර ද (වියදම හඳුනාගැනීම) සහ මෙය අපගේ තවමත් නිශ්චිතව හඳුනාගත නොහැකි ගෙවීමක් බැවින් උසාවි තීන්දුව ලැබෙන තුරු මෙය අසම්භාව්‍ය වගකීමක් ලෙස ශේෂ පත්‍රයේ පෙන්වීය. (2017 මූල්‍ය වර්ෂය) මෙහි තීන්දුව මේවන විට ලැබී තිබෙන අතර එය 2019 මූල්‍ය වර්ෂයේදී අප විසින් හඳුනාගත් අසම්භාව්‍ය වත්කම් හා වගකීම් හිලවු කර ද්විත්ව සටහනක් යොදා මූල්‍ය තත්ත්ව විස්තරයෙන් ඉවත් කෙරිණි.

(ඊ) සමාලෝචිත 2018 මූල්‍ය වර්ෂයේ දී ඔබ විසින් අසා ඇති මෙම රු. 602,039.00 ක මුදල ජංගම වත්කම් තුල දක්වා ඇති අතර එය ඇත්ත වශයෙන්ම එම වර්ෂයේ මෙහෙයුම් වියදමකි. මෙය සිදුවීමට හේතුව වූයේ වතුවල පවත්වාගෙන යන වාහන වියදම් පාලන ගිණුම් නොවීමයි. මෙය වතු ගිණුම් වල සිදුවූ යම් ශේෂ නොවී ඉතුරු වූ දෝෂයක් ලෙස හඳුනාගත් අතර මෙය 2019 මූල්‍ය වර්ෂයේම වියදමක් ලෙස හඳුනා ගැනීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කර ඇත. මේ අනුව 2019 මූල්‍ය වර්ෂයේ සිට මෙම සිදු කරයි.

(උ) (I) 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිලියෙල ඉදිරිපත් කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල ගෙවන ලද පොලී වියදම ගෙවන ලද (Finance Cost Paid) යනුවෙන් හඳුනාගෙන ඇත්තේ රු. 10,490,415.00 කි. එය පහත ඇමුණුමෙහි (ඇමුණුම 01) දක්වා ඇති අතර රු.12,090,415.00 ක මුදල හඳුනාගෙන ඇත්තේ මූල්‍ය වියදම වශයෙනි. එය උපචිත පදනම මත සිදුකල ගණුදෙනු සහ සිද්ධීන් වෙනුවෙන් සිදුකරනු ලබන ගැලපීම් යටතේ පෙන්නා ඇති අතර ඔබ විසින් සඳහන් කර ඇති හලාවත වැවිලි සමාගම වෙනුවෙන් මුදලින් නොගෙවන නමුත් පොලී වියදමක් ලෙස උපලබ්ධි වන මුදල රු. 1,600,000.00 ගැලපීම් වල වෙනමම දක්වා ඇත. එම ගණුදෙනුව වෙනමම දැක්වීම සිදුකල යුත්තක්ද නොකල යුත්තක්ද යන්න ගැලපීම් සිදුකිරීමේදී අදාල වන්නාවූ ආකාරය ශ්‍රී ලංකා ගිණුම්කර ප්‍රමිත අංක 7 ප්‍රකාරව සිදුකිරීමට අවශ්‍ය කටයුතු කරන බව සඳහන් කරන අතර මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලද මෙම මුදල් ප්‍රවාහය හේතුවෙන් මෙහෙයුම් මඟින් උත්පාදනය වන මුදල් ප්‍රවාහය අඩුවී තිබුණේ යැයි ප්‍රකාශයට එකඟ නොවේ. ගැලපීම් වල වෙනස දැන්වීමේදී (Presentation) වෙනමම දැක්වීමද නැත්නම් ශුද්ධ අගය දැක්වීමද යන්න සලකා බලා 2019 වර්ෂයේ සිට පිලියෙල කිරීමට කටයුතු සලසා ඇත.

(ඇමුණුම 1)

Net Profit /(Loss) Before Taxation		**(147,798,507)**	**(94,932,600)**
Adjustments for :			
Depreciation of Biological Assets	9.2	3,333,614	3,185,380
Depreciation of Assets	8	8,453,297	7,969,478
Road Rehabilitation Fund		-	148,078
Finance Expense	21	12,090,415	7,873,996
Gratuity Provision	16	25,853,232	36,159,924
Loan Interest		(1,600,000)	(1,600,000)
Audit fee Provisions		208,000	534,630
Insurance Provision		204,055	532,134
Management Fee Expenses		-	(172,409)
Over Provision of Holiday Pay		-	9,353,603
Prior year adjustments	26	(1,240,487)	(69,698,890)
Identified Diffrence			-
Profit before Working Capital Changes		**(100,496,382)**	**(97,446,676)**
Changes in Working Capital			
(Increase) / Decrease in Inventories		(23,058,701)	26,416,546
(Increase) / Decrease in Trade and Other Receivables		(9,158,581)	3,341,753
(Increase) / Decrease in Other Deposits		1,935,020	10,000
Increase / (Decrease) in Current Liabilities		(65,771,625)	(112,806,584)
Cash generated from operations		**(96,053,887)**	**(180,484,962)**
TRADE AND OTHER RECEIVABLES			
Gratuity Paid		(9,024,774)	(43,727,764)
Finance Cost Paid		(10,490,415)	(6,273,996)
Treasury Grants Received		158,000,000	264,000,000

(II) පෙර කාලච්ඡේදයන්ගේ ලාභය හෝ අලාභයට සිදුකරන ගැලපීම් වෙනුවෙන් රු. 1,240,487.00 ක් දක්වා තිබුණු අතර මෙම රු.159,349.00 ක වටිනාකමකින් මූල්‍ය ස්වරූපයේ නොවන ආරම්භක ශේෂයේ පැවති ශේෂයන්ගේ වෙනසක් පැවතිනි. එය පහතින් දැක්වේ.

(1) වතුයායන්හි සමුච්චිත ක්ෂය (දේපල පිරියත හා උපකරණ) ශේෂය ආරම්භක ශේෂය අවසන් ගිණුම්වලට අනුව රු. 289,862,495.00 ක් වූ අතර එය ලෙජර් ගිණුම්වලට අනුව රු. 289,803,147.00 විය. මෙහි වෙනස වූයේ රු. 59,349.00 කි.

(2) වතුයායන්ගේ ජීව විද්‍යාත්මක වත්කම්වල 2018 වර්ෂයේ ආරම්භක ශේෂය (ලෙජර් ගිණුම්වලට අනුව) 2018 අවසන් ගිණුමේ ශේෂය අතර පැවති රු.100,000 වෙනස මෙම රු. 159,349 ක මුළු ආරම්භක ශේෂ වෙනස 2018 අවසන් ගිණුම්වලට සිදු කරනු ලබන ගැලපීමක වෙනස වන අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිලියෙල කිරීමේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව නිවැරදි තර ගැනීමට කටයුතු කරමු. කෙසේ නමුත් මෙම ආරම්භක ශේෂ වෙනස වසර ගණනාවක් තිස්සේ පැමිණෙන වරදක් වන අතර එන නිවැරදි කරන ලද්දේ 2018 වර්ෂයේදිය.
මෙම හෙලිදරව්කිරීම 2019 වර්ෂයේ සිට නිවැරදි මෙය නිවැරදි කර ඇත.

(3) ප්‍රධාන කාර්යාලය මගින් පරිගණක මෘදුකාංග මිලදී ගැනීම සඳහා මුදලින් නොගෙවන රු. 253,500.00 ක මුදල ආයෝජන ක්‍රියාකාරම් තුල පවතී යන්න හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් මගින් ජනනය වන

ශුද්ධ මුදල් ප්‍රවාහයේ අඩුවීමක් සිදුවී කිබෙනවාද යන්න මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා අදාළ වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අධ්‍යනය කිරීමක් සිදුකර 2019 මූල්‍ය වර්ෂයේ සිට නිසි පරිදි හෙලිදරවු කිරීමක් සිදුකරීමට අවශ්‍ය පියවර ගෙන තිබේ.

1.2.4 නොසැසඳුණු පාලන ගිණුම්

මෙය ඉවත් කර යම් වරදක් සංස්ථාවේ ගිණුම්වල නිරූපණය විය හැකි යැයි (අනෙක් වතු ආශ්‍රිත ගිණුම් වලට සාපේක්ෂව) අදහසක් පවතී. යම් වෙනස් කිරීමක් සිදු කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා ඔබගෙන් උපදෙස් බලාපොරොත්තු වේ.

1.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

(අ) (ආ) ස්ථාවර වත්කම් ලේඛනය මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් ලේඛනය පිලියෙල කිරීම ද මේ වන විට ක්‍රියාත්මක වී ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව වාර්තා කිරීමටද මෙම කාරණා නිවැරදි කර ගනිමින් ඉදිරි 2021 මූල්‍ය වර්ෂයන්හිදී මේවා නිවැරදි කිරීමට අවශ්‍ය බව දන්වමින් අමාත්‍යාංශයට හා මහ භාණ්ඩාගාරයෙන් මූල්‍ය ප්‍රතිපාදන මේ වන විට සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතාවයන් නිසා මෙම වියදම් දැරීමට සංස්ථාව මේ මොහොතේ සමත් නොවේ. මේ සම්බන්ධව යම් සාධාරණ අවධානයක් යොමු කරන ලෙසද කාරුණිකව දන්වා සිටිමි.

1.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) මෙම මුදල්වලින් රු. 543,711,753.00ක් වසර 14 කට වඩා පැරණි ණය මුදලක් වන අතර මෙයින් 80% පමණ ප්‍රමාණයක් සමන්විත වන්නේ අර්ථසාධක අරමුදල්, භාරකාර අරමුදල් සහ ගෙවිය යුතු පාරිතෝෂික මුදල් වලිනි. මේවා ඇත්ත වශයෙන්ම සංස්ථාවේ ගෙවිය යුතු ණය ශේෂයන් ය. මේ සම්බන්ධව දැඩි අවධානයක් යොමු කර ඇති අතර මෙම ණය මුදල් අප ආයතනයේ සේවය කළ සේවකයින් හට ගෙවීම් වේ. මෙම ණය මුදල් ගෙවීම සඳහා ගරු සභාපතිතුමා ප්‍රධාන වූ අධ්‍යක්ෂක මණ්ඩලය තීරණ කිහිපයක්ම ගෙන ඇති අතර 2021 මූල්‍ය වර්ෂයේ දී මේ සඳහා ගෙවීම් කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත.

(ආ) SLSPC/PL/TB/T-88/2010 සහ SLSPC/PL/TB/T-111 යන ටෙන්ඩර් වලට ලබාගත් මුදල් (තැන්පතු අත්තිකාරම් මුදල්) නැවත ගෙවීමක් සිදු නොකර පවතින්නේ එම ගනුදෙනුකරුවන් සහ සංස්ථාව අතර ඇතිවූ යම් ගැටලුකාරී තත්ත්වයක් බැවිනි. මේ සඳහා අවශ්‍ය තොරතුරු මේ සමඟ ප්‍රසම්පාදන අංශයෙන් ලබා ගෙන ඉදිරි වර්ෂයේදී 2020 මූල්‍ය වර්ෂයේ දී අවශ්‍ය ගෙවීම් කටයුතු කිරීමට හෝ නොගෙවා මෙය සංස්ථාවට ආදායමක් වශයෙන් හඳුනා ගැනීමට කටයුතු කිරීමට සැලසුම් කරති.

(ඇ) 2018 දෙසැම්බර් 31 දිනට ඇල්කඩුව වැවිලි සමාගමෙන් අය විය යුතු මෙම රු.1,916,092 ක ශේෂය ඇල්කඩුව වැවිලි සමාගමෙන් ශේෂය සනාථ කරගෙන ඇති අතර එම මුදල අය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සූදානම් කරමින් පවතී. 2020, 2021 මූල්‍ය වර්ෂයන්හි දී මෙම ලැබිය යුතු ශේෂය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සංස්ථාවේ ඉහළ කළමනාකාරිත්වය තීරණය කර ඇත.

1.2.7 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

(අ) (ආ) මූල්‍ය වර්ෂ ගණනාවක් පුරාවට පැවත එන මෙම ගැටළුවට ප්‍රධාන හේතුව වන්නේ නිවැරදි ස්ථාවර වත්කම් ලේඛනයක් අප ආයතනයේ නොතිබීමයි. මෙය නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු 2020 මූල්‍ය වර්ෂය තුලදී සිදු කරන අතරම එයට අවශ්‍ය ස්ථාවර වත්කම් ලේඛනය (සියලුම වතු, ප්‍රාදේශීය කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය) මේ වන විට නිම කර තිබේ. මෙයට අදාල තක්සේරු කිරීම් සිදු කිරීමට අවශ්‍ය අරමුදල් සංස්ථාව සතු නොවන අතර පවතින මූල්‍ය දුෂ්කරතාවයන් මත අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරයේ සෘජු මැදිහත්වීමකින් මේ සඳහා අවශ්‍ය අරමුදල් ලබා දීමට අවශ්‍ය කටයුතු කරන මෙන් අමාත්‍යාංශයෙන් සහ මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලා ලිපි මේ වන විට සකස් කරමින් පවතී. ඉදිරි 2021 මූල්‍ය වර්ෂයන්හිදී මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට අවශ්‍ය අනෙකුත් කටයුතු මේ වන විටත් සිදු කරමින් තිබේ.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් තුළ රුපියල් 1,933,044.00 ක අක්‍රිය ගිණුම් ශේෂයක් වෙයි. මෙම ශේෂය ගිණුම් තුල පැන නගිනුයේ පහත අයුරිනි.

2004 වර්ෂයට පෙර සංස්ථාවේ ගිණුම් පිළියෙළ කිරීම සඳහා වතු ගිණුම් වෙනමද ප්‍රධාන කාර්යාලයේ ගිණුම් වෙනමද කොටස් 02 කට බෙදා වෙන් වෙන් වශයෙන්ද පවත්වාගෙන ගොස් තිබිණි. මෙය 2006 වර්ෂයේදී ප්‍රධාන කාර්යාලයේ පැවති ගිණුම් කොටස් දෙක එක් කිරීමේදී සිදු වූ වරදක් නිසා ඇති වූ වෙනස මෙම අක්‍රිය ගිණුම් රු.1,933,044.00 වෙනසෙන් නිරූපණය විය. මෙය ගිණුම් සැකසීමේදී සිදු වූ වරදක් බවට පෙනී ගොස් ඇති අතර මෙය ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු 2021 මූල්‍ය වර්ෂයේදී සිදු කිරීමට කටයුතු සූදානම් කර ඇත.

(ඈ) සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ සහ වතු ගිණුම් තුල පවතින පිළිවෙලින් රු. 103,131,935.00 ක් සහ රු.15,187,725.00 ක ණයහිමි වටිනාකම සනාථ කර ගැනීම සඳහා සංස්ථාවේ මූල්‍ය අංශය විසින් සනාථන ලිපි මේ වන විට (09 වනදා ජනවාරි 2020) ප්‍රධාන කාර්යාලය වෙත ඇමුණුම 01හි සඳහන් ණයහිමියන් ඔවුන්ගේ ශේෂ සනාථ කිරීම් සිදු කර අප වෙත එවා ඇත. එම ලිපි වල මුල්පිටපත් මේ සමඟ ඔබ වෙත එවීමට කටයුතු කර ඇත. තවද සනාථ කර ගැනීමට නොහැකිවූ ශේෂයන් ඉදිරියේ දී ඔවුන්ව සම්බන්ධ කර ගනිමින් සනාථ කරගැනීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත. මෙම සනාථ කිරීම් නොලැබීමට ප්‍රධාන වශයෙන් Covid-19 වසංගත තත්ත්වය තුළින් පැන නැගී ඇති ව්‍යාපාර ආයතන වල අභ්‍යන්තර කටයුතු වල සහ සන්නිවේදන මාධ්‍ය (තැපැල් සේවා) අකර්මණ්‍ය වීම හේතුවක් විය හැකිය. කෙසේ වෙතත් ඉහතින් සඳහන් කළ ඇමුණුමෙහි සඳහන් ශේෂයන් සනාථ කර එවන විට අප වෙත එවා ඇති ඔබ වෙත ලැබීමට සලස්වන ලද පිටපත් ද මේ වන විට ඔබ වෙත ලැබී ඇති බව අපගේ විශ්වාසයයි.
ණය ගැති ශේෂ තුල ඇතුලත් පසුකාලීන ශේෂ නිරවුල් කිරීමේ වාර්තාවේ සඳහන් රු. 53,881,380.00 දක්වා ඇත්තේ තවමත් නිරවුල් නොවූ ණය ඇති ශේෂයන්ය.

(ඉ) ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතු රු 6,379,570.00 ශේෂය 2006 වර්ෂයේ සිට සංස්ථාවේ ගිණුම්වල ගෙවිය යුතු ශේෂයක් වශයෙන් පෙන්නුම් කරනු ලබන අතර මෙය සඳහා කුමන ටෙන්ඩර් මත ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල් ලැබුනේද මෙවා කුමන ටෙන්ඩර්කරුවන් වෙත ගෙවිය යුතුවේද යන්න පිලිබඳ මේ වන විට නිසි ලේඛනයක් සංස්ථාව සතු නොවේ. මෙම ශේෂයන් 2020 මූල්‍ය වර්ෂය තුලදී පොත්වලින් ලියා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීමටද ඉන්පසු මහ භාණ්ඩාගාරය වෙත යොමු කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සූදානම් කර ඇත.

(ඊ) සමාලෝචිත වර්ෂ අවසානය දක්වා රු. 3,486,444.00 ක එකතු කළ අගය මත මෙම ගෙවිය යුතු මුදල ගනුදෙනුකරුවන්ගෙන් එක්කරගත් මුදලක් වන අතර ඒ වන විට පැවැති මූල්‍ය දුෂ්කරතා නිසා මෙම මුදල මේ වන විටත් ගෙවිය යුතු මුදලක් ලෙස මූල්‍ය තත්ව විස්තරයේ පෙන්නුම් කරනු ලබයි. නමුත් ඔබ විසින් පවසන පරිදි වාචිකව ඔබ වෙත එකතු කළ අගය මත බදු නිදහස් බවට ප්‍රකාශ කළා පමණක් යන්න ප්‍රතික්ෂේප කරමු. මන්ද යත් ඔබගේ විද්‍යුත් ලිපිනය වන jedb2016@gmail.com වෙත අප මූල්‍ය අංශයේ හර්ෂ මහතා විසින් 2020 අගෝස්තු මස 27 වන දා ප.ව. 12.02 ට ඔබ වෙත ඒ හා සම්බන්ධ දේශීය ආදායම් පනතේ සටහන් වගන්ති, අදාළ කරුණු සියල්ල ලබා දී තිබේ. එහි පැහැදිලි ලෙස 2014 අංක 13 දරන පනතේ 19 වන වගන්තිය යටතේ දක්වා ඇති පරිදි බදු නිදහස් (VAT) වන බෝගයන්ද යන්නත් ඒ සඳහා අදාළ වන අනෙක් තොරතුරුත් ඔබ වෙත සපයා ඇත.

(උ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට දී රු. 88,813,279.50 මුළු ලැබිය යුතු ශේෂයෙන් රු. 70,092,898.00ක් වසර 4ත් 14ත් අතර වේ. මෙම ශේෂයන් ඇත්ත වශයෙන්ම යම් මූල්‍ය වර්ෂයකදී ලබාදුන් ණය සහ ණය වශයෙන් ආයෝජනය කිරීම්වලින් සම්පූර් ණ වන අතර මේ සඳහා සෑම මූල්‍ය වර්ෂයකම ශේෂ සනාතන ලිපි යවනු ලබන අතර බොහොමයක් සනාථ කර නැවත ලැබී ඇත. මේවා අයකර ගැනීම සඳහා බොහොමයක් අවස්ථාවන් හිදී කළමනාකාරීත්වය පියවරයන් රාශියක් ගෙන ඇති අතර ඒ ඒ ආයතන වල ඇති මූල්‍ය දුෂ්කරතාවයන් නිසා 2018 මූල්‍ය වර්ෂය අවසන් වන තෙක්ම මෙම ශේෂයන් අයකර ගැනීමට අපොහොසත් විය. මෙම ශේෂයන්ගෙන් බොහොමයක් පාඩු ලබන රාජ්‍ය ආයතන වේ. මේ සම්බන්ධව

අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර යම්කිසි තීරණයන්ට එළඹ මේවා අයකර ගැනීමට අවශ්‍ය කටයුතු 2020,2021 මූල්‍ය වර්ෂයන්ගේ කටයුතු සම්පාදනය කර ඇත.

BCC ලංකා වෙනුවෙන් අප මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇති රු. 15,404,568.00 මුදල 2012 වර්ෂයේදී සමාගම විසින් නැවත අයකර ගත නොහැකි මුදලක් වශයෙන් වෙන් කිරීමක් මූල්‍ය තත්ත්ව විස්තරයට ගෙන ඇති අතර එම ශේෂය පොත් වලින් ඉවත් කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා 2020 මූල්‍ය වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයට යැවීමට අවශ්‍ය සියලු දේ සූදානම් කර ඇත. මෙය 2021 මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්ව විස්තරයෙන් ඉවත් කිරීමට නියමිත වේ.

(ඌ) 2012 වර්ෂයට පෙර පැවත එන රු. 1,591,349.00 වටිනා අඩමාණ ණය සහ විශේෂ හානිකරණ සඳහා වෙන් කිරීම් වටිනාකම මත රු. 47,537,070.00 ක ශේෂය නිර්මාණය වී ඇති ආකාරය විස්තරාත්මකව තොරතුරු ඔබ වෙත ලබා නොදුන් බව දක්වන මෙම ප්‍රකාශය හා එකග නොවේ. ඒ සඳහා විගණනය යන අතරතුරදී ඔබ වෙත ලේඛන ලබා දී ඇත.

(එ) මූල්‍ය වර්ෂ ගණනාවක් පුරාවට පැවත එන මෙම ගැටළුවට ප්‍රධාන හේතුව වන්නේ නිවැරදි ස්ථාවර වත්කම් ලේඛනයක් අප ආයතනයේ නොවීමයි. මෙය නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු 2020 මූල්‍ය වර්ෂය තුලදී සිදු කරන අතරම එයට අවශ්‍ය ස්ථාවර වත්කම් ලේඛනය (සියලුම වතු, ප්‍රාදේශීය කාර් යාලය හා ප්‍රධාන කාර් යාලය) මේ වන විට නිම කර තිබේ. මෙයට අදාල තක්සේරු කිරීම් සිදු කිරීමට අවශ්‍ය අරමුදල් සංස්ථාව සතු නොවන අතර පවතින මූල්‍ය දුෂ්කරතාවයන් මත අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරයේ ඍජු මැදිහත්වීමකින් මේ සඳහා අවශ්‍ය අරමුදල් ලබා දීමට අවශ්‍ය කටයුතු කරන මෙන් අමාත්‍යාංශයෙන් සහ මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලා ලිපි මේ වන විට සකස් කරමින් පවතී. ඉදිරි 2021 මූල්‍ය වර්ෂයන්හිදි මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට අවශ්‍ය අනෙකුත් කටයුතු මේ වන විටත් සිදු කරමින් තිබේ.

2.2.2

(අ) සේවක අර්ථ සාධක අරමුදල් සේවක, භාරකාර අරමුදල් හා ගෙවිය යුතු පාරිතෝෂික මුදල් 2018 මූල්‍ය වර්ෂය අවසන් වන විට රුපියල් 621,185,916.00 කි. මෙය 2002 වර්ෂයේ සිට පැවති කළමණාකරන දුර්වලතාවය මත පැවති මූල්‍ය දුෂ්කරතාවයන් හේතුවෙන් පැන නැගුණකි. මෙය වසර 50 ට ආසන්න කාලයක සිට ගෙවීමට කටයුතු නොකරයි යන ප්‍රකාශයට මා හට එකඟ විය නොහැක. මන්ද මෙම ශේෂයන් පටන් ගනුයේ 2000/2002 වර්ෂයන්ගෙන් පසුව බැවිනි. මෙම ගෙවිය යුතු ශේෂය ඔබ විමසීම් කර ඇති ශේෂයන් තුළ පවතී. මෙම ශේෂයන් 2021 වර්ෂයෙන් පටන්ගෙන ගෙවීම් කටයුතු කිරීම සඳහා ඉහත කී පරිද්දෙන් සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත ගෙවීම් කටයුතු කිරීමට සූදානම් කර ඇත.

(ආ) මෙය සංස්ථාවේ වසර කිහිපයක (වසර 12) පැවති අවසන් ගිණුම් ප්‍රමාදයක ප්‍රතිඵලයක් වශයෙන් දැක්විය හැකි අතර මේ වන විට 2018 වර්ෂයේ ගිණුම් පිලියෙල කරමින් සිටී. මෙහිදී 2020 අවසන් ගිණුම් එම නියමිත දිනට (2020.02.25) භාරදුන් බවට සතුටින් දැනුම් දීමට කැමැත්තෙමි.

(ඇ) (ඈ) මෙම අබලි ද්‍රව්‍ය තොගය කැලෑබොක්ක රාජ්‍ය වතුයායට ගෙන යන ලද්දේ අබලි ද්‍රව්‍ය සියල්ල එක් ස්ථානයකට එක්කොට ටෙන්ඩර් කැඳවා අබලි ද්‍රව්‍ය අපගණනය කිරීමටයි. මේ වන විට සියලු අබලි ද්‍රව්‍ය කැලෑබොක්ක රාජ්‍ය වතුයායේ පවතින අතර මෙම තොගය හෝ වෙනත් අබලි ද්‍රව්‍ය කිසිවක් භෞතික සත්‍යාපනයක් සිදු නොවීය. 2021 මූල්‍ය වර්ෂය තුලදී මෙම අබලි ද්‍රව්‍ය නිවැරදි තක්සේරුවක් සිදුකර ටෙන්ඩර් පටිපාටිය ඔස්සේ මිල ගණන් ගණන් කැඳවීමක් සිදුකර අබලි ද්‍රව්‍ය අපගණනය කර සංස්ථාවට ආදායමක් ලබා ගැනීමට තීරණය කර තිබේ.

2.2.4.1 ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රා ක්‍රියාවලිය

(අ) 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලසුමක් සකස් කර ඇති අතර එය 2018.05.02 අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

(ආ) කාර්යාලය නව පරිශ්‍රයක ස්ථාපනය කඩිනම් කිරීම සඳහා එසේ කර තිබුණි.

(ඇ) සේවා අවශ්‍යතාවය මත ආයතන නිලධාරීන්ගෙන් ලැබුණු වාචික උපදෙස් අනුව කටයුතු කර ඇත.

(ඈ) සුදුසුකම් ලත් තාක්ෂණික නිලධාරියකුගේ සහය නොමැති බව පිළිගනිමි.